# 2025.08.14 දින මහ සභා රැස්වීම
## අලව්ව ප්‍රාදේශීය සභාව

2025.08.14 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ සිව්වන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**මෙදින සහභාගී වූ  ගරු මන්ත්‍රීතුමන්ලා / මන්ත්‍රීතුමියන්ලා**

1. ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
2. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. චමින්ද මාල් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය

**මෙදිනසහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා / මන්ත්‍රීතුමියන්ලා**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එස්.එම්. යසින්තා සජීවනී සේනාරත්න මැතිනිය

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ සිව්වන මහ සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමිය ප්‍රධාන සියලු ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා මා ඉතාමත් ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා. එමෙන්ම, අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය සහ එම නිළධාරීන් සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

**01.2025.07.11 වන දින  මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.07.11 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව සභා සම්මත කිරීමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.07.11 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ස්ථිර කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. ඒ.කරුණාරත්න මැතිතුමා**
ගරුසභාපතිතුමනි, පසුගිය වාර්තාවේ මගේ කතාවේ නිවැරදි කිරීමක් තියනවා. මා විසින් ඉදිරිපත් කරන ලද  දෙවන යෝජනාව යටතේ අදහස් දැක්වීමේදී,

"2014 අපි ඒකට ජලය ගන්න ඉල්ලුම් පත්‍ර දුන්නා." සහ "2014 තමයි මේකේ වැඩ අවසන් වුණේ. " යන ප්‍රකාශයන්හි 2014, 2024 ලෙස සංශෝධනය විය යුතුයි.

තවද එහි සඳහන්  "මමත් ඒ ඉල්ලුම් පත්‍රය අරගෙන ජල සම්පත් මණ්ඩලයට භාර දුන්නා. භාර දුන්නහම,  රු.10150.00 ක් ගෙවන්න කීවා. ". යන ප්‍රකාශයේ මුදල රු.30150.00 ක් ලෙසද සංශෝධනය විය යුතු බවට ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම සංශෝධනවලට යටත්ව, සභා වාර්තාව සම්මත කිරීම මා ස්ථිර කරනවා

ඒ අනුව, 2025.08.14 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ඉහත සංශෝධනවලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**
**2.1. පලාත් පාලන සතිය 2025**
උක්ත කරුණට අදාලව රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PL/7/3 පළාත් පාලන සතිය 2025.08.04 දිනැති ලිපිය හා බැඳේ. එමඟින් රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පලාත් පාලන අමත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ සියලු ප්‍රාදේශීය සභාවන්හි මෙහෙයවීමෙන් පළාත් පාලන සතිය වැඩසටහන මෙවර 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 15 වන දින සිට සැප්තැම්බර් මස 21 දින දක්වා පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ඇති බවත්, මේ සතිය තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගරු නගරාධිපතිවරු සහ ගරු සභාපතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2025.08.07 වන දින පස්වරු 1.00 සිට zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වෙන බවත් දැනුම් දෙමි. මේ සාකච්ඡාවට අදාලව පළාත් පාලන සතිය පිළිබඳ අලච්ච ප්‍රාදේශීය සභාව යටතේ වැඩසටහනක් සම්පාදනය කර ඇත. ඒ පිළිබඳව ඔබට වැඩි විස්තර පසුව දැනුම් දෙමි. දැනට සම්පාදනය කර ඇති පළාත් පාලනය සතියේ  වැඩසටහන මා ඔබ හමුවේ තබනවා.

| අනු අංකය | පළාත් පාලන ආයතනය | දිනය | | ක්‍රියාත්මකකරනු ලබන වැඩසටහන/ වැඩසටහන් | පවත්වනු ලබනස්ථානය | ඉලක්කගත ප්‍රජාව/ක්ෂේත්‍ර | ඉලක්කගත සංඛ්‍යාව | සහභාගී කරවා ගනුලබන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන | අපේක්ෂිත වියදම (රු:) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2025.09.15 | ජංගම සේවා දිනය | 1.ආයුර්වේද සායනය හා බෝ නොවන රෝග සම්බන්ධ උපදේශනය | නුගවෙල ග්‍රාම නිළධාරී කොට්ඨාශය | නුගවෙල ග්‍රාම නිළධාරී කොට්ඨාශ ජනතාව | 200 | අලව්ව ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම්කාර්යාලය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, ගොවිජන සේවා කාර්යාලය, අලව්ව පොලිසිය, මයි විෂන් අක්ෂි සායන ආයතනය (පුද්) | 50,000.00 |
| | | | | 2.අක්ෂි සායනය හා උපදේශනය | | | | | |
| | | | | 3. රැකියා වෙළඳපොල | | | | | |
| | | | | 4.මහජන ඉල්ලීම් මත මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීම | | | | | |
| | | | | 5.අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා ස්වයං රැකියා පුහුණුව හා ව්‍යාපෘතිය නගා සිටුවීමට ආධාර කිරීම | | | | | |
| | | | | 6.ජන හමුව - ග්‍රාමීය ගැටළු හඳුනා ගැනීම හා 2026 වර්ෂය සඳහා සංවර්ධන යෝජනා ලබා ගැනීම | | | | | |
| | | | | 7.සෞඛ්‍ය උපදේශනය හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | | | | | |
| | | | | 8. සභා සේවාවන් හා ගැටළු හඳුනා ගැනීම | | | | | |
| 2 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2025.09.16 | පරිසර සහ රුක්රෝපණ දිනය | 1.පරිසරය සුරැකීම හා රුක් රෝපණයේ ඇති වැදගත්කම පිළිබඳ පෝස්ටරයක් නිර්මාණය කිරීම (5 ශ්‍රේණිය) | බල ප්‍රදේශ 5 ශ්‍රේණි දරුවන් | 5 ශ්‍රේණි දරුවන් | 500 | අලව්ව ප්‍රාදේශීය සභාව | 10,000.00 |
| | | | | 2.රුක් රෝපණය කිරීමේ වැඩසටහන් යටතේ සුළු අපනයන බෝග ,පලතුරු හා වන පැල ආදිය ජල පෝෂිත ප්‍රදේශ, සහා ඉඩම්වල පැෂන් පැල රෝපණය කිරීම හා ජනතාවට ලබාදිම. | බල ප්‍රදේශයේ ගම්මාන | ස්වෙච්ඡා සමිති සාමාජිකයන්, පරිසර බව කණ්ඩායම් | 200 | | 25,000.00 |
| | | | | 3.ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම වැළැක්වීමට සිවිල් සංවිධාන දැනුවත් කිරීම | නුගවෙල ග්‍රාම නිළධාරී කොට්ඨාශය | ගම්වාසීන් | 150 | | 5,000.00 |
| | | | | 4.ගෘහස්ත කොම්පෝස්ට් බඳුන් ප්‍රචලිත කිරීම | නුගවෙල ග්‍රාම නිළධාරී කොට්ඨාශය | ගම්වාසීන් | 5 | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 5. ඖෂධ පැල රෝපණය කිරීම | බෝවලාන පූජ්‍ය ශාලාව හා පුස්තකාල | පායක සමාජය | 25 | | ආයුර්වේද පැල තවාන |
| | | | | ගෙවතු වගා පිළිබඳ ගොවි සංවිධාන 64 ක් දැනුවත් කිරීම | ඒකාබද්ධ කොට්ඨාශ 15 | ගොවි සංවිධාන | 50 බැගින් | | |
| 3 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2025.09.17 | සෞඛ්‍ය හා සනීපාරක්ෂක දිනය | 1.ප්‍රාදේශීය සභාව හා රාජ්‍ය ආයතන , පරිසර සංවිධාන ඒකාබද්ධව අලව්ව නගරය පවිත්‍ර කිරීමේ ශ්‍රමදානය (ප්‍රධාන බස් නැවතුම, අලව්ව සතිපොල සහ කපුවරල ගිමන්හල) | අලව්ව නගරය | අලව්ව නගරයේ වෙළඳ පුජාව | 50 | අලව්ව ප්‍රාදේශීය සභාව, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය, අලව්ව පොලිසිය | 5,000.00 |
| | | | | 2. කසළ පොල පැවැත්වීම (නොදිරන ද්‍රව්‍ය නිසි ලෙසවර්ග කර වෙන් කිරීම පුරුදු කිරීම , කසළ වලට ආර්ථික වටිනාකමක් ලබා දීම , වැඩි ප්‍රමාණයක් ගෙන එන ශිෂ්‍යයින් 10 දෙනෙකුට ත්‍යාග ලබා දීම | රතනාලංකාර මහා විද්‍යාලය / වයඹ ජනාධිපති විද්‍යාලය | පාසල් දරුවන් | 2000 | අලව්ව ප්‍රාදේශීය සභාව | 20,000.00 |
| | | | | 3. ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය සමග ඒකාබද්ධව ඩෙංගු මර්දන වැඩසටහන (අලව්ව කුරුණෑගල බස් නැවතුම අවට තණකොල කපා සෝදා පිරිසිදු කිරීම) | අලව්ව කුරුණෑගල බස් නැවතුම | නාගරික ව්‍යාපාර ස්ථාන හා නිවාස | 80 | අලව්ව ප්‍රාදේශීය සභාව, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය, අලව්ව පොලිසි | 5,000.00 |
| | | | | 4. ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සමග සුනඛයන් එන්නත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම | ශුද්ධාගාත් ස්ථානය | ශුද්ධාගාත් ස්ථානය | 20 | අලව්ව ප්‍රාදේශීය සභාව, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 5. බල ප්‍රදේශයේ තෝරාගත් දහම්පාසල් 10 ක 8,9 ශ්‍රේණි දරුවන් සඳහා පරිසර දැනුම මිනුම තරග 3 ක් පවත්වා තෑගි හා සහතික ලබා දීම | හදුනාගත් දහම් පාසල් | හදුනාගත් දහම් පාසල් | 30 | නුගවෙල ශ්‍රී පුරාණ විහාරස්ථානය, අලව්ව ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 10,000.00 |
| | | | | 6. අලව්ව නගරයේ තේ කඩ, ආපනශාලා , හෝටල්හා බේකරි පරීක්ෂා කිරීමේ වැඩසටහන | අලව්ව නගරය | අලව්ව නගරයේ ව්‍යාපාර | 20 | අලව්ව ප්‍රාදේශීය සභාව, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය, අලව්ව පොලිසිය | |
| 4 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2025.09.18 | ආදායම් ප්‍රවර්ධන දිනය | 1.සමාජ මාධ්‍ය හරහා බදු ගෙවන ජනතාව දැනුවත් කිරීම | බල ප්‍රදේශය | අලව්ව නාගරික බල ප්‍රදේශය | 4000 | අලව්ව ප්‍රාදේශීය සභාව | |
| | | | | 2.ජංගම ආදායම් එකතු කිරීමේ වැඩසටහන | අලව්වප්‍රධාන කාර්යාල බල ප්‍රදේශය | අලව්ව නාගරික බලපදේශය | 25 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2,500.00 |
| | | | | 3.අක්කර බදු සමීක්ෂණය | කැප්පිටිවලාන උප කාර්යාල බල ප්‍රදේශය | කැප්පිටිවලාන බලප්‍රදේශය | 10 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2,500.00 |
| 5 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2025.09.19 | සාහිත්‍ය, අධ්‍යාපන සහ පුස්තකාල ප්‍රවර්ධන දිනය | 1. පාඨක සමාජ ශක්තිමත් කිරීමේ අරමුණින් පාඨක සමාජ අතර තරඟ පැවැත්වීම (චිත්‍ර, කථික, රචනා, නිසදැස්) | අලව්ව, බෝයවලාන, මහරච්චිමුල්ල පාඨක සමාජ | පාඨක සමාජය | 1000 | අලව්ව ප්‍රාදේශීය සභාව | 10,000.00 |
| | | | | 2. පුස්තකාල පරිශ්‍ර තුල පොත් ප්‍රදර්ශන පැවැත්වීම | අලව්ව, බෝයවලාන, මහරච්චිමුල්ල පාඨක සමාජ | පාඨක සමාජය | 1000 | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 3. පෙර පාසල් දරුවන් හා දෙමාපියන් සම්බන්ධ කර ගනිමින් නිර්මාණාත්මක වැඩසටහනක් පැවැත්වීම | පෙරපාසල් දෙමාපිය සංවර්ධන සමිති | දරුවන් හා දෙමාපියන් | 150 | | 3,000.00 |
| | | | | 4. E library ප්‍රවර්ධන වැඩසටහන යටතේ උපකරණ ලබා දීම | අලව්වමහජන පුස්තකාලය | පුස්තකාල කාර්ය මණ්ඩලය | 4 | | 300,000.00 |
| | | | | 5.පාසල් අතර විවාද තරඟය පැවැත්වීම | බල ප්‍රදේශයේ පාසල් | 11,12,13 වසර | 65 | | |
| 6 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2025.09.20 | මහජන උපයෝගිතා සහ ක්‍රීඩා දිනය | 1.අලව්ව සතිපොල භූමිය සංවර්ධනය කිරීම හා ඉහල මහලයට ගේට්ටුවක් සහ ජංගම වේදිකාවක් සකස් කිරීම | අලව්ව සතිපොළ | අලව්ව සතිපොළ භාවිතා කරන්නන් | 1250 | අලව්ව ප්‍රාදේශීය සභාව | |
| | | | | 2.අලව්ව මස් වෙළඳසැල් අසල පදිකවේදිකාව සහ කාණුව සකස් කිරීම | අලව්ව නගරය | පාරිභෝගිකයින් | 200 | | |
| | | | | 3.අලව්ව නගරයේ වීදි ලාම්පු නඩත්තුව සහ වගකීම් පැවරීම | අලව්ව නගරය | මහජනතාව | 10 | | |
| | | | | 4.සුසානභූමි සුද්ධ පවිත්‍රකිරීමේ ශ්‍රමදාන 14 ක් සිදු කිරීම | අලව්ව බල ප්‍රදේශය | ගම්වාසීන් | 50 | | |
| | | | | 5.අලව්ව මහජන ක්‍රීඩාංගනය සුද්ධපවිත්‍ර කිරීම හා දැල් ආවරණය ගැසීම | අලව්ව නාගරික | ක්‍රීඩකයින් | 25 | | 300,000.00 |
| | | | | 6.කල් ඉකුත් වූ බැනර් කපා ඉවත් කිරීම | අලව්ව නාගරික කොට්ඨාශ | නාගරික ජනතාව | 5 | | 2,500.00 |
| | | | | 7. ගල්දෙණිය නාන තොටුපල පරිශ්‍රය හා මාර්ගය දෙපස කැලෑ කපා පවිත්‍ර කිරීමේ ශ්‍රමදානය (ගල්දෙණි ප්‍රජාමණ්ඩලය ) | ගල්දෙණිය වසම | ගල්දෙණියගම වාසීන් | 50 | | 5,000.00 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 1. ප්‍රජා මණ්ඩල හා අලව්ව ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලය සමග ඒකබද්ධව සැහැල්ලු පන්දු (සීමිත පන්දුවාර) ක්‍රිකට් තරඟාවලිය | බල ප්‍රදේශයේ ප්‍රජා මණ්ඩල සාමාජික හා කාර්ය මණ්ඩලය | ප්‍රජා මණ්ඩල සාමාජික, මහජන නියෝජිතවරු හා කාර්ය මණ්ඩලය | 15 කණ්ඩායම් | අලව්ව ප්‍රාදේශීය සභාව | 100,000.00 |
| | | | | 2. ප්‍රජා මණ්ඩල, යෞවන සමාජක්‍රීඩා සංගම් හා අලව්ව ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලය සමග ඒකබද්ධව ශාරීරික සුවතා වැඩසටහනක් පැවැත්වීම | බල ප්‍රදේශයේ ප්‍රජා මණ්ඩල සාමාජික හා කාර්ය මණ්ඩලය | ප්‍රජා මණ්ඩල සාමාජික, මහජන | 150 | අලව්ව ප්‍රාදේශීය සභාව, යෞවන සේවා නිලධාරී | 5,000.00 |
| 7 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2025.09.21 | සහතිකපත් ප්‍රදානය හා සම්මන්ත්‍රීය | 3. තිළිණ සහ සහතිකපත් ප්‍රදානය කිරීම | බල ප්‍රදේශයේ තරග වලට ඉදිරිපත්වූවන් | තරග වලට සහභාගී ව ජයගත් ශිෂ්‍ය | 50 | අලව්ව ප්‍රාදේශීය සභාව | 20,000.00 |
| | පළාත් පාලනසතිය වෙනුවෙන් ප්‍රචාරක කටයුතු | | | අලව්ව, බෝයවලාන, මහරච්චිමුල්ල නගර වල බැනර් 03 ක්ප්‍රදර්ශනය කිරීම | | | 3 | අලව්ව ප්‍රාදේශීය සභාව | 6,000.00 |
| | | | | සමාජ මාධ්‍ය භාවිතා කිරීම | | | | | |
| ඇස්තමේන්තු ගත මුළු වියදම | | | | | | | | | 886,500.00 |

**03.** ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම

**3.1.** නිවාඩු පිළිබඳ දැනුවත් කිරීම.

(I) නිවාඩු අනුමත කර දෙන ලෙස ඉල්ලීමක් කරමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්.අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා විසින් 2025.08.07 දින ඉදිරිපත් කර ඇති ලිපිය
එම ලිපියෙහි, අසනීප තත්වයක් හේතුවෙන් රෝහල් ගත වී ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවන බැවින් 2025.08.14 දින මහ සභාව සඳහා පැමිණිය නොහැකි බව සඳහන් කර ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්.අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමාගේ නිවාඩුව අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.08.14 වන දින මහ සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ඉහත සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා හට එදින නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ඒකමතිව සභා සම්මත විය.

**04.** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

**05. යථා පරිදි කල්දී ඇති යෝජනා**

**(05-1) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව**
**අංක 07/04/05/01 දරණ යෝජනාව**
**2026 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් අලව්ව ප්‍රාදේශිය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2025 වර්ෂයේදී බලාත්මක කරන ලද අක්කර බදු 2026 වර්ෂය සඳහා ද පිළිගැනීමටත්,

එකී පනතේ 134 වන වගන්තියේ (3)වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස්කර නොමැත්තාවූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ -

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩිවූ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2026 වර්ෂය සඳහා රුපියල් දහය (රු.10) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv(ආ)වන කොටසේ 1989.03.10 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩුවූ සෑම ඉඩමක් මත, 2026 වර්ෂය සඳහා රුපියල් පනහ (රු.50) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළයුතු යයි දඅලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජේ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙම බදු පැනවීම සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනවා. ඉස්සර කරත්තවලට, පෝනියන්ට, අලින්ට, බයිසිකල්වලට බද්දක් තිබ්බා. ඒත් අය කරගත්තේ නැහැ. නමුත් එම බදු සම්මත කරා. පෙර තිබුණු බදු අය කිරීම සිදු කළේ කොහොමද?, දැන් මිල වැඩි කිරීමක් සිදු වෙලා තිබෙනවාද යන වග මෙහි යෝජනා කරලා තිබෙන බදු සම්බන්ධයෙන් ලේකම්තුමියගෙන් පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීම සඳහා යෝජනා කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජේ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙම මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීම සඳහා යෝජනා කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙතෙක් පැවති කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.
ගියවර බදු දීම් ගාස්තුවලට සාපේක්ෂව වෙනස් වුණු ගාස්තු ටික සඳහන් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අක්කර බදු මීට පෙර අය කරාද?

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි, අය කරගෙන තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ගොවිජන සේවා එකෙනුත් අක්කර බදු අය කරනවා. ඒකට අමතරවද අද සභාවෙන් අය කිරීම සිදු කරන්නේ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි, ගොවිජන සේවා එකට අමතරව ප්‍රාදේශීය සභාවෙනුත් මෙතෙක් අය කරගෙන තියනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙතෙක් නම් මගෙන් අය කරගෙන නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. චමින්ද මාල් මැතිතුමා**
ගරු සභාපතිතුමනි,මෙතෙක් අය කරගෙන තිබෙනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා,තුමියන්ලා මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීම සඳහා යෝජනා කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙම මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා,තුමියන්ලා කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීම සඳහා යෝජනා කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙතෙක් පැවති කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එදා ඉඳලා හැම වර්ෂයකම මෙම බදු දීම් සම්මත වුණා. මේකේ බදු පැනවීමක් වෙන්නේ නැහැ. මේක ක්‍රියාත්මක කළේත් නැහැ. නිලධාරීන් ගිහිල්ලා එකතු කර ගත්තෙත් නැහැ. ඒ පුද්ගලයෝ ඇවිත් සල්ලි බැන්දෙත් නැහැ. මේ තියන තත්වය අනුව මේක මේ ආකාරයටම සම්මත කරගෙන පරණ ක්‍රියාවලියටම යමු. අපි ගිහිල්ලා රු.10.00 ඉල්ලනකොට ඕක මිනිස්සුන්ට කෝටියක් ඉල්ලනවා වගේනේ දැනෙන්නේ. මේකේ එකක්වත් වැඩි කරලා නැහැනේ.

ඒ අනුව 2026 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-2) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව**
**අංක 07/04/05/02 දරණ යෝජනාව**
**2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ අලව්ව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1659 හා 2010.06.18 දිනැති ගැසට් පත්‍රය යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල ගොඩනැගිලිවල ඉඩම්වල ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2016 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුව 2026 වර්ෂයේ තක්සේරුව ලෙස පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134(1) උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපල මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හතරක (4%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අයකිරීමටත්,

තවද 2006 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද සමාන වාරික හතරකින් අලව්ව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්

එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2006 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් දඑකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාල වරිපනම් බදු මුදල අලව්ව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවට අදාළ මුදලින් 5 % ක වට්ටමක්ද අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

<u>උපලේඛනය</u>

| කාර්තුව | ගෙවිය යුතු දිනය | 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය. |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2026.03.31 | 2026.01.31 |
| දෙවන කාර්තුව | 2026.06.30 | 2026.04.30 |
| තුන්වන කාර්තුව | 2026.09.30 | 2026.07.31 |
| හතරවන කාර්තුව | 2026.12.31 | 2026.10.31 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්.ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-3) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව**
**අංක 07/04/05/03 දරණ යෝජනාව**
**2026 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උප ලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2026 වර්ෂයේදී පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු මතම එහි 11 වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අයකිරීමට අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

<u>උපලේඛනය</u>

| | I වන තීරුව | II වන තීරුව |
|---|---|---|
| (I) | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින්රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | රු.25.00 |

| | | |
|---|---|---|
| (II) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ කරත්තයක් සඳහා - | |
| | (අ) වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම් | රු.18.00 |
| | (ආ) වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | රු.4.00 |
| (III) | සෑම කරත්තයක් සඳහා | රු.20.00 |
| (IV) | සෑම අත්කරත්තයක් සඳහා | රු.10.00 |
| (V) | සෑම රික්ෂෝවක් සඳහා | රු. 7.50 |
| (VI) | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | රු.15.00 |
| (VII) | සෑම ඇතෙකු සඳහා | රු.50.00 |

(02) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2026 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-4) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව**
**අංක 07/04/05/04 දරණ යෝජනාව**
**2026 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අයකිරීම**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 126 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2010.07.16 දින අංක 1663 දරන ගැසට් පත්‍රයේ, වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් අනුමතකොට ප්‍රකාශයට පත්කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව අලව්ව ප්‍රාදේශීය සභාව මඟින් වැළඳගෙන ඒ බව 2011.07.22 අංක 1716 ගැසට් පත්‍රයේ iv(අ) වැනි කොටසේ පලකරනු ලැබූ අතර, එම අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ප්‍රාදේශීය සභා සීමාව තුල වාහන නවතා තැබීම සම්බන්ධයෙන් පහත උපලේඛනය පරිදි ගාස්තුවක් 2026 වර්ෂය සඳහා අයකල යුතු බවත්, එකී ගාස්තුව ගෙවිය යුතු තැනැත්තෙකු විසින් 2026 අප්‍රේල් මස 30 දිනට පෙර අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

## උපලේඛන

| | | රු. ශත |
|---|---|---|
| 01. | වාහනය ලියාපදිංචි කිරීමේ ගාස්තුව | 100.00 |
| 02. | කාර්,වෑන් සහ ත්‍රී රෝද රථ සඳහා මාසික ගාස්තුව | 100.00 |
| 03. | බර වාහන සඳහා මාසික ගාස්තුව | 125.00 |
| 04. | ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් සඳහා මාසික ගාස්තුව | 75.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2026 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අයකිරීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-5) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව**
**අංක 07/04/05/05 දරණ යෝජනාව**
**2026 වර්ෂය සඳහා ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු අයකිරීම**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසි කරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනු නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක් (1%) සමාන බද්දක් හා අංක 1882/22 හා 2014.10.01 දිනැති ඉඩම් කට්ටි කිරීමේ සම්මත අතුරු ව්‍යවස්ථාවේ 15 වන වගන්තියේ සඳහන් සංවර්ධන සැලැස්ම හෝ අනු බෙදුම අනුමත කරවා ගැනීම සඳහා පරීක්ෂණ ගාස්තු වශයෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2026 වර්ෂය සඳහා පනවා අයකල යුතු බවටත්, එකී බදු හා ගාස්තු කොන්ත්‍රාත් විකිණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**(එසේ උවද, නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේදී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලද අංක 223554 – 2021/07/08 අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසිවල සඳහන් ගාස්තු අයකල යුතුය)**

උපලේඛනය

| ඉඩමේ ප්‍රමාණය | සංවර්ධන සැළැස්ම අනුමත කිරීම සඳහා ගාස්තුව | අනුබෙදුම අනුමත කිරීම සඳහා ගාස්තුව |
|---|---|---|
| | රු. ශත | රු. ශත. |
| හෙක්ටයාර් 01 ට අඩු | 500.00 | 500.00 |
| හෙක්ටයාර් 01 ට වැඩි 2 දක්වා | 700.00 | 700.00 |
| හෙක්ටයාර් 02 ට වැඩි 4 දක්වා | 1000.00 | 1000.00 |
| හෙක්ටයාර් 04 ට වැඩි | 1250.00 | 1250.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2026 වර්ෂය සඳහා ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු අයකිරීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-6) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව**
**අංක 07/04/05/06 දරණ යෝජනාව**
**2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් /දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු අය කිරීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122(අ) වගන්තිය සමග කියවිය යුතු 122 සහ 126 වන වගන්තිවලින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව, 1988.08.23 වැනි දින අංක 520/7 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින්, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා, අලව්ව ප්‍රාදේශීය සභාව මගින් වැළඳගෙන ඒ බව 1998.08.28 වැනි දින අංක 1043 ගැසට් පත්‍රයේ iv (ආ) කොටසේ පළකරනු ලැබූ අතර, එම අතුරු ව්‍යවස්ථාවල 39 වැනි අතුරු ව්‍යවස්ථාව වන ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන අනුව, අලව්ව ප්‍රාදේශීය සභා සීමාව තුල යම් වීදියකට, පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එම ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙක් දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දවස් හතකට කලින් අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**(එසේ උවද, නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේදී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලද අංක 223554- 2021/07/08 අති විශේෂ ගැසට් පත්‍රයේ සදහන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි වල සඳහන් ගාස්තු අයකල යුතුය)**

**උපලේඛනය**

| ප්‍රචාරක දැන්වීම් විස්තරය | අවසර පත්‍ර ගාස්තුව රු. ශත |
|---|---|
| 01. ප්‍රචාරක වෙළඳ දැන්වීමක්, පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් ස්ථානයක සවි කිරීමේදී එක් හතරැස් අඩියකට (ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා)- වසරකට | 150.00 |
| 02. යම් තැනැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවිකර ඇති හෝ මහජනතාවට දැනගැනීමට හැකිවන පරිදි හෝ යම් තැනක සවිකර තබන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් සඳහා එක් හතරැස් අඩියකට (තාවකාලික දැන්වීමක් සඳහා) - මසකට | 50.00 |
| 03. වෙන්දේසි ඉඩම් සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් හතරැස් අඩියකට - මසකට | 100.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් / ඈශ්‍රා පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු අය කිරීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-7) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/04/05/07 දරණ යෝජනාව**

**2026 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා සීමාව තුළ පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු අයකිරීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122(අ) වගන්තිය සමග කියවිය යුතු 122 සහ 126 වන වගන්තිවලින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව, 2010.07.16 වැනි දින අංක 1663 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින්, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, ප්‍රවාහන, පරිසර, සංචාරක, ආයෝජන, සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදා හැරීමේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා, අලව්ව ප්‍රාදේශීය සභාව මගින් වැළඳගෙන ඒ බව 2011.07.22 වැනි දින අංක 1716 ගැසට් පත්‍රයේ iv (ආ) කොටසේ පළකරනු ලැබූ අතර, එම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව, අලව්ව ප්‍රාදේශීය සභා සීමාව තුල පාරවල් සහ මංමාවත් සැරසිලි කරීම වෙනුවෙන් බලපත්‍ර ගාස්තුවක් සහ සැරසිලි කරන ප්‍රමාණය පදනම් කරගෙන පහත සඳහන් පරිදි තැම්පත් මුදලක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එම ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙක් සැරසිලි කරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දවස් තුනකට පෙර අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

| | රු. ශත |
|---|---|
| 01.බලපත්‍ර ගාස්තුව | 1000.00 |
| 02.තැම්පත් මුදල මීටර් 1ක් සඳහා | 10.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2026 වර්ෂය සඳහා දේශීය සහා සීමාව තුළ පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු අයකිරීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**<u>(05-8) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/04/05/08 දරණ යෝජනාව</u>**

**<u>2026 වර්ෂය සඳහා 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම</u>**

වයඹ පළාත් සභාවේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල කරනු ලබන යම් ව්‍යාපාරයක් සඳහා පරිසර බලපත්‍රයක් ලබාගතයුතු යම් තැනැතතෙකුගෙන්, පහත උපලේඛනයේ සඳහන් පරිදි බලපත්‍ර ගාස්තුවක් හා පරීක්ෂණ ගාස්තුවක් 2026 වර්ෂය සඳහා පනවා අයකලයුතු බවටත්, එකී ගාස්තුව බලපත්‍රය ලබාගැනීමට පෙර අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

<u>උපලේඛනය</u>

| | |
|---|---|
| 01.නියමිත පරිදි සකස් කරන ලද ප්‍රශ්නාවලිය සඳහා අයදුම්පත්‍ර ගාස්තුව | රු. 100.00 |
| බලපත්‍ර අළුත්කිරීම සඳහා අයදුම්පත්‍ර ගාස්තුව | රු. 50.00 |
| බලපත්‍ර ගාස්තුව | රු. 1250.00 |

02. පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තුව :-
මූලික ආයෝජනය

| | රු. ශත |
|---|---|
| රු. 100,000.00 දක්වා | 1000.00 |
| රු. 100,001.00 සිට 200,000.00 දක්වා | 1500.00 |
| රු. 200,001.00 සිට 500,000.00 දක්වා | 2500.00 |
| රු. 500,001.00 සිට 1000,000.00 දක්වා | 5000.00 |
| රු. 1,000,001.00 සිට 1,500,000 දක්වා | 7500.00 |
| රු.1,500,001.00 සිට ඉහළට | 10000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2026 වර්ෂය සඳහා 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**<u>(05-9) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/04/05/09 දරණ යෝජනාව</u>**

**<u>2026 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සහතික, ලබාදෙනු ලබන සේවාවන් ගාස්තු පැනවීම</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් සහතිකයක් හෝ සේවාවක් ලබාදීම සඳහා එම උපලේඛනයේ 11 වන තීරුවේ ඒ ඒ සහතිකය හෝ සේවාව සැපයීම වෙනුවෙන් සඳහන් කර ඇති ගාස්තුව 2026 වර්ෂය සඳහා පනවා අයකල යුතු බවටත්, එකී සේවාව හෝ සහතිකය ලබාගන්නා යම් තැනැත්තෙකු විසින් ඒ සේවාව හෝ සහතිකය ලබාගැනීමට පෙර එම ගාස්තුව අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

## උපලේඛනය

1 වන තීරුව 11 වන තීරුව

01.වීථිරේඛා සහ නොපවරා ගැනීමේ සහතික, ගොඩනැගිලි සීමා සහතික සහ හිමිකම් සහතිකයක් සඳහා රු. 700.00
ඒ සඳහාවන තැන්පත්මුදල රු. 100.00

02.වීථිරේඛා සහ නොපවරා ගැනීමේ සහතික, ගොඩනැගිලි සීමා සහතික සහ හිමිකම් සහතිකයක් සඳහාඉල්ලුම්පත රු.100.00

03. දේපල අයිතිය හැරවීම, වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීම ඉල්ලුම්පත් රු.250.00

04.නව වරිපනම් අංක ඉල්ලුම් කරීමේ අයදුම්පත් රු.500.00

05.ගොඩනැගිලි අනුකූලතා සහතිකයක් සඳහා ඉල්ලුම්පත් රු.100.00

06. ග්‍රාමීය හා නාගරික ගොඩනැගිලි අයදුම්පත් සඳහා රු.750.00

07.ගොඩනැගිලි අයදුම්පත අනුමත කිරීමේදී පෙරසැරි ගාස්තු

| ගෙබිම ප්‍රමාණය (ව.මී) | නේවාසික - තනි පුද්ගල | නේවාසික - මහල් නිවාස | නේවාසික නොවන |
|---|---|---|---|
| ව.මී. 400 දක්වා | රු. 15.00 | රු. 20.00 | රු. 20.00 |
| ව.මී. 401 - 1000 | රු. 17.00 | රු. 22.00 | රු. 22.00 |
| ව.මී. 1001- 1500 | රු. 20.00 | රු. 25.00 | රු. 25.00 |
| ව.මී. 1501- 2000 | රු. 20.00 | රු. 27.00 | රු. 27.00 |
| ව.මී. 2000 ට වැඩි | වැඩිවන සෑම ව.මී. 90 ක් සඳහාම රු. 1500.00 බැගින් | වැඩිවන සෑම ව.මී. 90 ක් සඳහාම රු. 1800.00 බැගින් | වැඩිවන සෑම ව.මී. 90 ක් සඳහාම රු. 1800.00 බැගින් |

08. නීත්‍යානුකූලකළ හැකි අනවසර ඉදිකිරීම් නීත්‍යානුකූල කිරීමේ ගාස්තු
(ඉහත සඳහන් ගාස්තුවලට අමතරව අයකරනු ලබන ගාස්තු)

| **සංවර්ධනයේ ස්වභාවය** | **අයකළයුතු ගාස්තු** | |
|---|---|---|
| **1. අනුමැතියකින් කොරව ගොඩනැගිලි ඉදිකිරීම් / එකතු කිරීම් / නැවත ඉදිකිරීම්** | **නේවාසික (ව.මී. 1කට)** | **නේවාසික නොවන (ව.මී. 1කට)** |
| I. අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට (කයිරු මට්ටම දක්වා) | රු. 100.00 | රු. 500.00 |
| II. වහල මට්ටම දක්වා ඉදිකිරීම් - ටැම් සහ බාල්ක ඇතුළුව ඉදිකර ඇති විට(වහල හැර) | රු. 200.00 | රු. 900.00 |
| III. වහලය සහිත බිත්ති ඉදිකිරීම | රු. 300.00 | රු. 1200.00 |
| IV. පදිංචිවීම සඳහා සුදුසු පරිදි ඉදිකිරීම් සම්පූර්ණ කිරීම | රු. 400.00 | රු. 1 500.00 |
| V. මායිම් තාප්ප /රුදවුම් බිත්ති ඉදිකිරීම | රු. 100.00 දික් මීටරයක් සඳහා | රු. 400.00 දික් මීටරයක් සඳහා |
| **VI. අනුකූලතා සහතික (Coc) ලබා නොගෙන පදිංචි වීම** | දිනකට රු. 75.00 | |

09. ඉදි කිරීම් සඳහා වන සංශෝධන බලපත්‍ර වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීම

| වර්ග ප්‍රමාණය (ව.මී) | ගාස්තුව (රු.) |
|---|---|
| ව.මී. 1 000 දක්වා | රු. 2 500.00 |
| ව.මී. 1 000 වැඩි | රු. 5 000.00 |

10. අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු

| සංවර්ධන කාර්යයේ ස්වභාවය | අයකළයුතු ගාස්තු | | | |
|---|---|---|---|---|
| | **ගෙබිම ප්‍රමාණය (ව.මී)** | **නේවාසික** | | **නේවාසික නොවන** |
| | | **තනි පුද්ගල** | **මහල් නිවාස** | |
| ගොඩනැගිලි ඉදිකිරීම | ව.මී. 400 දක්වා | රු. 2 500.00 | රු.4 000.00 | රු. 3 500.00 |
| | ව.මී. 400 වැඩි | රු.2 500.00 + ව.මී. 400 ට වැඩිවන සෑම ව.මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින් | රු.4 000.00 + ව.මී. 400 ට වැඩිවන සෑම ව.මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 15.00 බැගින් | රු.3 500.00 + ව.මී. 400 ට වැඩිවන සෑම ව.මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 20.00 බැගින් |
| සංනිවේදන කුළුණු, ඇන්ටෙනා / සම්ප්‍රේෂණ කුළුණු සඳහා | | රු. 5 000.00 | | |

11. වානිජ පරමාර්යෙන් සිදුකරනු බලන පිහිනුම් තටාක (තටාකයේ ඩෙක් සමඟ) සහ සූර්ය පැනල සඳහා වන ගාස්තු

| වර්ග ප්‍රමාණය (ව.මී) | ගාස්තුව (රු.) |
|---|---|
| ව.මී. 300 දක්වා | රු. 6 000.00 |
| ව.මී. 301 - 500 | රු. 15 000.00 |
| ව.මී. 501 – 1 000 | රු. 30 000.00 |
| ව.මී. 1 000 ට වැඩි | රු. 30 000.00 +වැඩිවන සෑම ව.මී. 100 හෝ ඉන් කොටසක් සඳහා රු. 1 000.00 බැගින් |

12. සංවර්ධන බලපත්‍රයක් වෙනත් පාර්ශවයකට පැවරීම - රු 20000.00

13. දුරකථන කුළුණු/ඇන්ටනා කුළුණු ඉදිකිරීම :-

| | | |
|---|---|---|
| I. විදුලි සංදේශ, සම්ප්‍රේෂණ සහ ඇන්ටෙනා කුළුණු ඉදිකිරීම | බිම්පාද ඉදිකිරීම | රු.200 000.00 |
| | වහල මුදුන ඉදිකිරීම | රු.150 000.00 |

**(එසේ උවද, නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල ගොඩනගිලි සැලැසුම් අනුමත කිරීමේදී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලද අංක 223554- 2021/07/08 අති විශේෂ ගැසට් පත්‍රයේ සදහන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි වල සදහන් ගාස්තු අයකල යුතුය)**

14. ඉඩම් කට්ටිකිරීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා රු.1000.00

15. අගරු චෙක්පතක් සඳහා දඩ මුදල් රු.100.00

16. පිඹුරුපතක් අනුමත කිරීමේ ඉල්ලුම්පත් රු.100.00

17. පිඹුරුපතක් අනුමත කිරීමේ ගාස්තු රු.750.00

18. වරිපනම් ලේඛනයේ උපුටන ලබාගැනීම, දේපල තක්සේරු ලේඛනයක් සඳහා රු.500.00

19. වරිපනම් නොගෙවන බවට සහතිකයක් ලබාදීම සඳහා රු.200.00

20. නැතිවූ සහතිකයක පිටපතක් ලබාගැනීම සඳහා රු.250.00

21. අනතුරුදායක ගසක් ඉවත්කිරීම සඳහාවන අයදුම්පත් සඳහා රු.500.00
අනතුරුදායක ගස් පරීක්ෂණ ගාස්තු රු.500.00

22. ජල බවුසරය කුලියට දීම සඳහා ගාස්තු

I. ස්ථාවර ගාස්තුව රු.2500.00
II. වැඩිවන සෑම බවුසරයක් සඳහාම රු.750.00 බැගින්
III. ජල ප්‍රවාහන ගාස්තුව කිලෝ මීටර් 01 ක් සඳහා (යාම් ඊම් වෙනුවෙන්) රු.360.00

23. කාබනික පොහොර (කොම්පෝස්ට් පොහොර) කිලෝ එකක් සඳහා රු.20.00
(එකවර කිලෝ 1000 කට වැඩි ප්‍රමාණයක් මිලදී ගනු ලබන්නේ නම් 10% වට්ටමක් ලබාදෙනු ලැබේ)

24. කොඩිකනු සඳහා ගාස්තු
පැය 12 ක් හෝ 12 කට අඩු කාලයක් සඳහා රු.50.00
පැය 12 කට වැඩි පැය 24 කට අඩු කාලයක් සඳහා රු.80.00
එක් කොඩි කණුවක් සඳහා තැන්පත් මුදල රු.300.00

25.සමහට් කුලියට දිමේ ගාස්තු

| ඒකකය | තැන්පත් මුදල | බල ප්‍රදේශය තුළ | | බල ප්‍රදේශයෙන් පිටත | |
|---|---|---|---|---|---|
| | | එක් දිනකට | වැඩිවන දිනයක් සඳහා | එක් දිනකට | වැඩිවන දිනයක් සඳහා |
| එක් සමහට් එකක් සඳහා | 5000.00 | 1000.00 | 800.00 | 1200.00 | 1000.00 |
| ප්‍රවාහන ගාස්තු කි.මී.1 | | 360.00 | | 360.00 | |

26. සභාව සතු අලව්ව බස් නැවතුම්පල හෝ සභාව සතු වෙනත් භූමියක ඇතුළුකරන සෑම මගී ප්‍රවාහන
බස් රථයකින්ම දිනකට එක්වරක් පමණක් අයකරන ගාස්තුව රු.50.00

27. ජලනල එලීමට මාර්ගය පළුදුකිරීම සඳහා ගාස්තුව
තාරදැමූ මාර්ග (වර්ග අඩියක් සඳහා) රු.500.00
කොන්ක්‍රීට් දැමූ මාර්ග (වර්ග අඩියක් සඳහා) රු.400.00
බොරළු දැමූ මාර්ග (වර්ගඅඩියක් සඳහා) රු.100.00
බොරළු දැමූ මාර්ගයක මාර්ග උරහිස කැපීම (වර්ගඅඩියක් සඳහා) රු.100.00

28.ගලි බවුසර සේවාව සඳහා අයකරනු ලබන ගාස්තුව

| | |
|---|---|
| **පරීක්ෂණ ගාස්තු** | රු.1000.00 |
| ස්ථාවර ගාස්තු(පළමු ලෝඩ්එක සඳහා) | රු.4000.00 |
| වැඩිවන සෑම ලෝඩ් එකක් සඳහා | රු.2100.00 |
| රියදුරු හා සහායක දීමනා | රු.1000.00 |
| ප්‍රවාහන ගාස්තුව කිලෝ මීටර් 01 ක් සඳහා (යාම් ඊම් වෙනුවෙන්) | රු.600.00 |

29. පුස්තකාල මගින් අයකරනු ලබන ගාස්තු

| | |
|---|---|
| පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු | රු.25.00 |
| පුස්තකාල සාමාජික ගාස්තු:- | |
| ළමුන් සඳහා | රු.50.00 |
| වැඩිහිටියන් සඳහා | රු.100.00 |
| පුස්තකාල සාමාජිකත්වය වාර්ෂිකව අළුත් කිරීමේ ගාස්තු:- | |
| ළමුන් සඳහා | රු.50.00 |
| වැඩිහිටියන් සඳහා | රු.50.00 |

30. ප්‍රමාදයන් සඳහා දඩ මුදල් අයකිරීමට-

| | | |
|---|---|---|
| 1. දින 01 සිට දින 30 දක්වා එක් දිනකට එක් පොතකට | - | රු.2.00 බැගින් |
| 2. දින 31 සිට දින 90 දක්වා එක් පොතකට | - | රු.80.00 |
| 3. දින 91 සිට දින 180 දක්වා එක් පොතකට | - | රු.160.00 |
| 4. දින 180 කට වැඩි දින සඳහා එක් පොතකට | - | රු.200.00 |

31.අලව්වප්‍රාදේශීය සභාවට අයත් සුසානභූමිවල මෘතදේහ තැන්පත් කිරීමේ ගාස්තු - වර්ග අඩි 1 ක් සඳහා - රු.3000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
2026 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සහතික, ලබාදෙනු ලබන සේවාවන් ගාස්තු පැනවීමට අදාල යෝජනාවෙහි අනු අංක 11 යටතේ පනවා ඇති වානිජ පරමාර්යෙන් සිදුකරනු බලන සූර්ය පැනල සඳහා වන ගාස්තු අය කිරීම හැර අනිකුත් ගාස්තු පැනවීමේ යෝජනාව සභා සම්මත කිරීම සඳහා පිළිගැනීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2026 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සහතික, ලබාදෙනු ලබන සේවාවන් ගාස්තු පැනවීමට අදාල යෝජනාවෙහි අනු අංක 11 යටතේ පනවා ඇති වානිජ පරමාර්යෙන් සිදුකරනු ලබන සූර්ය පැනල සඳහා වන ගාස්තු අය කිරීම හැර අනිකුත් ගාස්තු පැනවීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>(05-10) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/04/05/10 දරණ යෝජනාව</u>**

**<u>2026 වර්ෂය සඳහා (176 වැනි අධිකාරය) ප්‍රසිද්ධ රඟදැක්වීම් ආඥා පනත යටතේ පනවනු ලබන ගාස්තු</u>**

(176 වැනි අධිකාරය ) ප්‍රසිද්ධ රඟදැක්වීම් ආඥා පනතේ (31) වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත මුදල් අයකර පෙන්වනු ලබන සංදර්ශන සඳහා පහත උපලේඛනයෙහි සඳහන් ගාස්තුවක් 2026 වර්ෂයට පනවා අයකලයුතු බවටත්, එකී බලපත්‍ර ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙක් සංදර්ශනය පැවැත්වීමට යටත් පිරිසෙයින් දින තුනකට පෙර අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

## උපලේඛනය

01. මුදල් අයකර පෙන්වනු ලබන සංගීත සංදර්ශනයක් හැර අනිකුත් සංදර්ශන සඳහා

| | රු. ශත |
|---|---|
| එක් දිනකට | 100.00 |
| එක් සතියකට | 500.00 |
| එක් මසකට | 1500.00 |

02. මුදල් අයකර පෙන්වනු ලබන සංගීත සංදර්ශනයක් සඳහා
එක් දිනකට රු.1000.00 බැගින්

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2026 වර්ෂය සඳහා (176 වැනි අධිකාරය) ප්‍රසිද්ධ රඟදැක්වීම් ආඥා පනත යටතේ පනවනු ලබන ගාස්තු අය කිරීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-11) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව**
**අංක 07/04/05/11 දරණ යෝජනාව**
**2026 වර්ෂය සඳහා ප්‍රජා ශාලා සහ ක්‍රීඩාපිටි කුලියට දීම වෙනුවෙන් ගාස්තු අයකිරීම**

අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් අලව්ව සහ බෝයවලාන ප්‍රජාශාලා ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් පිළිවෙලින් පහත උපලේඛන අංක 01 සහ 02 හි සඳහන් ආකාරයට ආරක්ෂිත ඇපයක් සහ කුලී මුදලක් 2026 වර්ෂය සඳහා අයකලයුතු බවටත්. අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් මහජන ක්‍රීඩාංගන සහ මහජන ක්‍රීඩාංගන නොවන වෙනත් එළිමහන් ස්ථාන ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් පහත උපලේඛන අංක 3 හි සඳහන් ආකාරයට ආරක්ෂිත ඇපයක් සහ කුලී මුදලක් 2026 වර්ෂය සඳහා අයකලයුතු බවටත්,ප්‍රාදේශීය සභාවට අයත් ඉහත සඳහන් දේපල ප්‍රයෝජනයට ගනු ලබන යම් තැනැත්තෙක් එම දේපල ප්‍රයෝජනයට ගැනීමට පෙර අදාල කුලී මුදල අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛන අංක 01**
**සතිපොල උඩමහල කුලියට දීම**

| අනු අංකය | කාරණය | ආරක්ෂිත ඇප රු.ශත | පැය 6ක් /පැය 6 කට අඩු කාලයක් සඳහා කුලී මුදල රු.ශත | පැය 6 ට වැඩි පැය 12 ක් හෝ 12 ට අඩු කාලයක් සඳහා කුලී මුදල රු.ශත | පැය 12 ට වැඩි පැය 24 ක් හෝ 24 ට අඩු කාලයක් සඳහා කුලී මුදල රු.ශත |
|---|---|---|---|---|---|
| 01 | පොත් ප්‍රදර්ශනයක් සඳහා<br>(1). පළමු දින<br>(2). දෙවන දින<br>(3). තෙවැනි දින | 5000.00 | 3000.00<br>2400.00<br>1800.00 | 6000.00<br>4800.00<br>3600.00 | 9000.00<br>7200.00<br>5400.00 |
| | | | | | |
| 02 | ආබාධිතයන්ගේ උත්සවයක් සඳහා | 5000.00 | 1200.00 | 2400.00 | 3600.00 |
| | | | | | |
| 03 | වාණිජ වෙළඳ ප්‍රදර්ශනයක් සඳහා | 5000.00 | 3600.00 | 7200.00 | 10800.00 |
| | | | | | |
| 04 | වාණිජ සල්පිලක් සඳහා | 5000.00 | 3600.00 | 7200.00 | 10800.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |
| 05 | ත්‍යාග ප්‍රධානෝත්සවයක් සඳහා | 5000.00 | 1200.00 | 2400.00 | 3600.00 |
| | | | | | |
| 06 | රූපලාවන්‍යය ප්‍රදර්ශනයක් සඳහා | 5000.00 | 2400.00 | 4800.00 | 7200.00 |
| | | | | | |
| 07 | විවාහ මංගල උත්සවයක් සඳහා (සභා බලප්‍රදේශයට අයත්) | 5000.00 | 3000.00 | 6000.00 | 9000.00 |
| | | | | | |
| 08 | විවාහ මංගල උත්සවයක් සඳහා (සභා බලප්‍රදේශයෙන් පිටත) | 5000.00 | 4200.00 | 7700.00 | 126000.00 |
| | | | | | |
| 09 | රැස්වීමක් සමග සුහද හමුවක් සඳහා | 5000.00 | 1800.00 | 3600.00 | 5400.00 |
| | | | | | |
| 10 | අධ්‍යාපනික සම්මන්ත්‍රණයක් සඳහා (ගාස්තු අය නොකරන) | 5000.00 | 2400.00 | 4800.00 | 7200.00 |
| | | | | | |
| 11 | අධ්‍යාපනික සම්මන්ත්‍රණයක් සඳහා (ගාස්තු අය කරන) | 5000.00 | 3600.00 | 7200.00 | 10800.00 |
| | | | | | |
| 12 | පෙර පාසැල් උත්සවයක් සඳහා | 5000.00 | 1800.00 | 3600.00 | 5400.00 |
| | | | | | |
| 13 | පංති පැවැත්වීම සඳහා | 5000.00 | 2400.00 | 4800.00 | 7200.00 |
| | | | | | |
| 14 | දානමය කටයුත්තක් සඳහා | 5000.00 | 1200.00 | 2400.00 | 3600.00 |
| | | | | | |
| 15 | නාට්‍ය/සංගීත සංදර්ශන සඳහා | 5000.00 | 3600.00 | 7200.00 | 10800.00 |
| | | | | | |
| 16 | ස්වයංරැකියාව පිළිබඳ දැනුවත් කිරීමක් සඳහා | 5000.00 | 1200.00 | 2400.00 | 3600.00 |
| | | | | | |

## උපලේඛන අංක 02

## බෝයවලාන ප්‍රජාශාලාව කුලියට දීම

| අනු අංකය | කාරණය | ආරක්ෂිත ඇප රු.ශත | පැය 6ක් /පැය 6 කට අඩු කාලයක් සඳහා කුලී මුදල රු.ශත | පැය 6 ට වැඩි පැය 12 ක් හෝ 12 ට අඩු කාලයක් සඳහා කුලී මුදල රු.ශත | පැය 12 ට වැඩි පැය 24 ක් හෝ 24 ට අඩු කාලයක් සඳහා කුලී මුදල රු.ශත |
|---|---|---|---|---|---|
| 01 | පොත් ප්‍රදර්ශනයක් සඳහා<br>(1). පළමු දින<br>(2). දෙවන දින<br>(3). තෙවැනි දින | 5000.00 | 2400.00<br>1500.00<br>600.00 | 4800.00<br>3000.00<br>1200.00 | 7200.00<br>4500.00<br>1800.00 |
| 02 | ආබාධිතයන්ගේ උත්සවයක් සඳහා | 5000.00 | 600.00 | 1200.00 | 1800.00 |
| 03 | වාණිජ වෙළඳ ප්‍රදර්ශනයක් සඳහා | 5000.00 | 3000.00 | 6000.00 | 9000.00 |
| 04 | වාණිජ සල්පිලක් සඳහා | 5000.00 | 3000.00 | 6000.00 | 9000.00 |
| 05 | ත්‍යාග ප්‍රධානෝත්සවයක් සඳහා | 5000.00 | 600.00 | 1200.00 | 1800.00 |
| 06 | රූපලාවන්‍යය ප්‍රදර්ශනයක් සඳහා | 5000.00 | 1200.00 | 2400.00 | 3600.00 |
| 07 | විවාහ මංගල උත්සවයක් සඳහා (සභා බලප්‍රදේශයට අයත්) | 5000.00 | 3000.00 | 6000.00 | 9000.00 |
| 08 | විවාහ මංගල උත්සවයක් සඳහා (සභා බලප්‍රදේශයෙන් පිටත) | 5000.00 | 4200.00 | 8400.00 | 12800.00 |
| 09 | රැස්වීමක් සමග සුහද හමුවක් සඳහා | 5000.00 | 1500.00 | 3000.00 | 4500.00 |
| 10 | අධ්‍යාපනික සම්මන්ත්‍රණයක් සඳහා (ගාස්තු අයනොකරන) | 5000.00 | 700.00 | 1400.00 | 2100.00 |
| 11 | අධ්‍යාපනික සම්මන්ත්‍රණයක් සඳහා (ගාස්තු අය කරන) | 3000.00 | 900.00 | 1800.00 | 2700.00 |
| 12 | පෙර පාසැල් උත්සවයක් සඳහා | 3000.00 | 600.00 | 1200.00 | 1800.00 |
| 13 | පංති පැවැත්වීම සඳහා | 3000.00 | 600.00 | 1200.00 | 1800.00 |
| 14 | දානමය කටයුත්තක් සඳහා | 3000.00 | 600.00 | 1200.00 | 1800.00 |
| 15 | නාට්‍ය/සංගීත සංදර්ශන සඳහා | 3000.00 | 3000.00 | 6000.00 | 9000.00 |
| 16 | ස්වයං රැකියාව පිළිබඳ දැනුවත් කිරීමක් සඳහා | 3000.00 | 600.00 | 1200.00 | 1800.00 |

උපලේඛන අංක 03

**අලවිව මහජන ක්‍රීඩාංගනය සහ මහජන ක්‍රීඩාංගන නොවන සභාව සතු වෙනත් එළිමහන් ස්ථාන කුලියට දීම**

| අනු අංකය | කාරණය | ආරක්ෂිත ඇප රු.ශත | පැය 12 ක් හෝ ඊට අඩු කාලයක් සඳහා කුලී මුදල රු.ශත | පැය 12 ට වැඩි පැය 24 ක් හෝ 24 ට අඩු කාලයක් සඳහා කුලී මුදල රු.ශත |
|---|---|---|---|---|
| 01 | සියළුම ප්‍රසිද්ධ මහජන රැස්වීම් සඳහා | 10000.00 | 3750.00 | 5500.00 |
| 02 | මුදල් අයකර පෙන්වනු ලබන සංගීත සංදර්ශන හෝ එවැනි වෙනත් කාර්යයන් | 15000.00 | 7500.00 | 11250.00 |
| 03 | නොමිලේ පවත්වනු ලබන සංගීත සංදර්ශන හෝ එවැනි වෙනත් කාර්යයන් | 20000.00 | 5000.00 | 7500.00 |
| 04 | මුදල් අයකර පවත්වනු ලබන ක්‍රීඩා තරඟ හෝ උත්සව සඳහා | 5000.00 | 7500.00 | 11000.00 |
| 05 | නොමිලේ පවත්වනු ලබන ක්‍රීඩා තරඟ හෝ උත්සව සඳහා | 5000.00 | 5000.00 | 7500.00 |
| 06 | වාණිජ සල්පිල් සඳහා | 5000.00 | 5000.00 | 7500.00 |
| 07 | ආගමික උත්සව/ පෙර පාසල් උත්සව ඇත වෙනත් උත්සව | 5000.00 | 2500.00 | 3750.00 |
| 08 | මහජන ක්‍රීඩාංගන නොවන සභාව සතු වෙනත් එළිමහන් ස්ථානයක් සඳහා - අලවිව නාගරික බල ප්‍රදේශය තුල | | 3750.00 | 5500.00 |

**බෝයවලාන මහජන ක්‍රීඩාංගනය සහ මහජන ක්‍රීඩාංගන නොවන සභාව සතු වෙනත් එළිමහන් ස්ථාන කුලියට දීම**

| අනු අංකය | කාරණය | ආරක්ෂිත ඇප රු.ශත | පැය 12 ක් හෝ ඊට අඩු කාලයක් සඳහා කුලී මුදල රු.ශත | පැය 12 ට වැඩි පැය 24 ක් හෝ 24 ට අඩු කාලයක් සඳහා කුලී මුදල රු.ශත |
|---|---|---|---|---|
| 01 | සියළුම ප්‍රසිද්ධ මහජන රැස්වීම් සඳහා | 5000.00 | 2500.00 | 3750.00 |
| 02 | මුදල් අයකර පෙන්වනු ලබන සංගීත සංදර්ශන හෝ එවැනි වෙනත් කාර්යයන් | 5000.00 | 6250.00 | 9250.00 |
| 03 | නොමිලේ පවත්වනු ලබන සංගීත සංදර්ශන හෝ එවැනි වෙනත් කාර්යයන් | 5000.00 | 3750.00 | 5500.00 |

| | | | | |
|---|---|---|---|---|
| 04 | මුදල් අයකර පවත්වනු ලබන ක්‍රීඩා තරග හෝ උත්සව සඳහා | 2500.00 | 6250.00 | 9250.00 |
| 05 | නොමිලේ පවත්වනු ලබන ක්‍රීඩා තරග හෝ උත්සව සඳහා | 2500.00 | 3750.00 | 5500.00 |
| 06 | වාණිජ සල්පිල් සඳහා | 2500.00 | 3750.00 | 5500.00 |
| 07 | ආගමික උත්සව/ පෙර පාසල් උත්සව ඇත වෙනත් උත්සව | 2500.00 | 1800.00 | 2500.00 |
| 08 | මහජන ක්‍රීඩාංගන නොවන සභාව සතු වෙනත් එළිමහන් ස්ථානයක් සඳහ බොයවලාන/ මහරච්චිමුල්ල ප්‍රදේශය තුල | | 1800.00 | 2500.00 |

**සැ.යු.:-01. ප්‍රජා ශාලාව/ <u>සතිපොල උඩුමහල</u> දීර්ඝ කාලීනව කුලියට දෙන්නේ නම්(සතියකට වැඩි කාලයක් සඳහා) ආරක්ෂිත ඇප මුදල රු.10000.00 අය කල යුතුයි.**

**02. ප්‍රජා ශාලාව සතිපොල උඩුමහල කුලියට දීමේදී වැයවන විදුලිය සඳහා අය කිරීම විදුලිබල මණ්ඩලය විසින් ඒකකයක් සඳහා කලින් කලට අයකරනු ලබන ගාස්තු මුදල අය කල යුතුය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2026 වර්ෂය සඳහා ප්‍රජා ශාලා සහ ක්‍රීඩාපිටි කුලියට දීම වෙනුවෙන් ගාස්තු අයකිරීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**<u>(05-12) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/04/05/12 දරණ යෝජනාව</u>**

<u>2026 වර්ෂය සඳහා ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තු පැනවීම</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 93 වන වගන්තිය සහ 126 වන වගන්තියේ සඩ වන උප වගන්තියේ (ආ) සහ (ඇ) ජේදවලින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව, 2015.09.25 වැනි දින අංක 1933/40 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින්, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය යටතේ වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලනය, මානව සම්පත්, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, පරිසර, සංචාරක, ආයෝජන සම්බන්ධීකරණ, සමූපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදාහැරීම් ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රාදේශීය සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව, අලව්ව ප්‍රාදේශීය සභාව මගින් වැළඳගෙන 2016.03.18 වැනි දින අංක 1959 ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පළකරනු ලැබූ එම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව 2026 වර්ෂය සඳහා පහත අංක 01 උපලේඛණයේ 01 වන තීරුවේ සඳහන් එම සේවාව පවත්වාගෙන යනු ලබන ගෘහස්ථ නොවන ඒකක හා වෙළඳ පරිශ්‍රවලින් එකී උපලේඛණයේ 02 වන තීරුවේ සඳහන් ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තුවක් පනවා අයකිරීම සුදුසු බවට අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

<u>අංක 01 උපලේඛණය</u>

**<u>01 වන තීරුව</u>** **<u>02 වන තීරුව</u>**

01. වීථියකට හෝ මංමාවතකට යාබදව පිහිටි ගසක් හෝ ගසක කොටසක් කපා ඇති විටක එය ඉවත්කිරීම සඳහා (ට්‍රැක්ටර් ලෝඩ් එකක් සඳහා) රු.1000.00

02. නිවාස පරිශ්‍රයන්වලින් බැහැර කරන සතුන්ගේ මලකුණු, ශරීර කොටස් - (එක් වරක් ප්‍රවාහනය සඳහා) රු.1000.00

03. සාප්පු සහ කාර්යාල පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය සඳහා වාර්ෂික ගාස්තුව (තොග සහ සිල්ලර වෙළඳාම, ආහාර පාන අලවිය , රූපලාවන්‍ය සැලෝන්) රු.600.00

04. පදික වෙළඳාම හෝ සංචාරක වෙළඳාම නිසා ජනනය වන අපද්‍රව්‍ය (උපද්‍රවකාරී අපද්‍රව්‍ය හැර) සඳහා වාර්ෂික ගාස්තුව රු.360.00

05. කර්මාන්ත ශාලා මගින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය සඳහා වාර්ෂික ගාස්තුව රු.18000.00

06. කැනීම් ඉදිකිරීම් හා කඩා දැමීම් මගින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය සඳහා (ට්‍රැක්ටර් ලෝඩ් එකක් සඳහා) රු.1000.00

07. රජයේ ආරෝග්‍යශාලා පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය (සායනික හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය හැර) සඳහා වාර්ෂික ගාස්තුව රු.600.00

08. පෞද්ගලික රෝහල් හා රසායනාගාරපරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය (සායනික හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය හැර) සඳහා වාර්ෂික ගාස්තුව රු.6000.00

09. වෙනත් පරිශ්‍ර (ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1500.00 ට අඩු කුඩා ව්‍යාපාර) රු.300.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2026 වර්ෂය සඳහා ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තු පැනවීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**<u>(05-13) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව</u>**
**<u>අංක 07/04/05/13 දරණ යෝජනාව</u>**
**<u>2026 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියේ (1) වන උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටි කිසියම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු විටක හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කල හැකි විටක එවැනි යම් ඉඩමක,

01.ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ,

02.ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ

එකී ඉඩම සංවර්ධනය නොකල ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකල ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම මත 2026 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම දෙක (0.2%) ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකල ඉඩම මත බද්ද 2026 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි විධාන කිරීමටත් අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2026 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-14) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/04/05/14 දරණ යෝජනාව**

**2026 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට දීම සඳහා ගාස්තු පැනවීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පහත උප ලේඛනයේ අංක 1 හි 1 වන තීරුවේ සඳහන් වාහන හා යන්ත්‍ර කුලියට ලබාදීම සඳහා එම උපලේඛනයේ 2 වන තීරුවේ සඳහන් කර ඇති ගාස්තුවකුත්, උප ලේඛනයේ අංක 2 හි 1 වන තීරුවේ සඳහන් වාහනය සඳහා 2 වන තීරුවේ සඳහන් ගාස්තුවත් 3 වන තීරුවේ සඳහන් ගාස්තුවත්, 2026 වර්ෂය සඳහා පනවා අයකල යුතු බවටත්, එකී සේවාව ලබාගන්නා යම් තැනැත්තෙකු විසින් එම සේවාව ලබාගැනීමට පෙර එම ගාස්තුව අලව්ව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවටත් අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛණ අංක 1**

| 1 වන තීරුව | 2 වන තීරුව | 3 වන තීරුව |
|---|---|---|
| | ඉන්ධන සහිතව | ඉන්ධන රහිතව |
| 01. මෝටර් ග්‍රේඩරය (NWZA - 5298) - මීටර් පැයකට | රු.7555.00 | රු.4110.00 |
| 02. JCB බැකෝ ලෝඩරය (NWZA- 5067) - මීටර් පැයකට | රු.6000.00 | රු.2555.00 |

**උපලේඛණ අංක 2**

| 1 වන තීරුව | 2 වන තීරුව |
|---|---|
| 01. ටිපර් රථය (LL- 6946) - කිලෝමීටරයක් සඳහා | රු. 360.00 |
| 02. ස්ථාවර ගාස්තුව (අවමපැය 10 ක් සඳහා) | රු.14000.00 |

**උපලේඛණ අංක 2**

| 1 වන තීරුව | 2 වන තීරුව |
|---|---|
| තණකොළ කැපීම සඳහා පැය 1 කට | රු.1800.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2026 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට දීම සඳහා ගාස්තු පැනවීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-15) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/04/05/15 දරණ යෝජනාව**

**2026 වර්ෂය සඳහා කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාල අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම**

අලව්ව ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ අලව්ව ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ අලව්ව ප්‍රාදේශීය සභාව විසින් 2026 වර්ෂය තුලදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත උප ලේඛණයෙහි 1 වන තීරුවේ නිරූපිත එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛණයේ 11 වන තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී බලපත්‍ර ගාස්තුව 2026 අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත්, අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලය, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විටදී, ඊට අදාල බලපත්‍ර ලබාදීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2025 වර්ෂයේ ලැබීම්වලින් සියයට එකක් (1%) බලපත්‍ර ගාස්තුව ලෙස 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවටද, මම යෝජනා කරමි.

## උපලේඛනය

| 1 වන තීරුව | | 11 වන තීරුව | | |
|---|---|---|---|---|
| | කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750/- නොඉක්මවන අවස්ථාවක | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750/- ඉක්මවන එහෙත් රු.1500/- නොඉක්මවන අවස්ථාවක | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1500/- ඉක්මවන අවස්ථාවක |
| 1) | ලැගුම් නිවාසයක් සහ නවාතැන්පලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 2) | හෝටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 3) | බත්කඩයක් හෝ ආපනශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 4) | තේ හෝ කොපි කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 5) | බේකරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 6) | කිරිපට්ටියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 7) | කිරි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 8) | ආහාර නිපදවීමේ සහවිකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 9) | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10) | මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 11) | අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12) | සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13) | ඇඳුම් පිරිසිදු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 14) | සංචාරක වෙළඳාම සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 15) | ගවගාලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 16) | පෞද්ගලික වෙළඳපොලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 17) | කොණ්ඩා සැකසීමේ සැලුන් හලක් සහ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

## අප්‍රසන්න ව්‍යාපාර

| | | | | |
|---|---|---|---|---|
| 1. | මිණිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 2. | පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබාගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 3. | සම් පදම් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 4. | සම් විකිණීමට තබාගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 5. | සත්ව පාලනය (මස් කිරි හෝ බිත්තර සඳහා ) | 500.00 | 750.00 | 1000.00 |
| 6. | උම්මලකඩ නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 7. | රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබාගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 8. | පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 9. | තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබාගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150 කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 11. | මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | පොල්කටු අඟුරු හෝ දැව අගුරු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 13. | දුම්කොළ වියලීම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | සත්ව ආහාර නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | පුන්නක්කු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 16. | සත්ව මාංශ හෝ ලේ පැසවීම | 500.00 | 750.00 | 1000.00 |
| 17. | සබන් නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 18. | සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 19. | ට්‍රන්ක් පෙට්ටි සෑදීම | 500.00 | 750.00 | 1000.00 |
| 20. | අළුත්ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 21. | ලෝහ සුන්බුන් තබාගැනීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| 22. ගෘහ භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 23. වේවැල් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 24. වඩු කරමාන්ත ශාලාවක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 25. සිරප් හෝ පළතුරු බීම නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 26. රස කැවිලි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 27. පොල්ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම ) | 500.00 | 750.00 | 1000.00 |
| 28. බුරුසු වර්ග නිපදවීම ( දත් බුරුසු හැර ) | 500.00 | 750.00 | 1000.00 |
| 29. දත් බුරුසු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 30. රා එකතු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 31. විනාකිරි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 32. දැව ඉරීම | 500.00 | 750.00 | 1000.00 |
| 33. පින්තාරු තීන්ත, වාර්නිස් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 34. සෝඩා නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 35. කෙඳි සායම් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 36. සම් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 37. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 38. කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 39. බේකින් පවුඩර් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 40. ගෑස් මැන්ටල් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 41. පොටි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 42. ඉටිපන්දම් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 43. කපුරු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 44. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 45. රෙදි සෝදන නිල් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 46. ලාකඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 47. සුවඳ විලවුන් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 48. පාසල් රටහුණු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 49. ටයර් හෝ ටියුබ් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 50. ටයර් නැවත පිරවීම | 500.00 | 750.00 | 1000.00 |
| 51. ටයර් ටියුබ් වොල්කනයිස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 52. සිමෙන්ති නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 53. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 54. වැලි කඩදාසි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 55. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 56. ගඩොල් පිලිස්සීම | 500.00 | 750.00 | 1000.00 |
| 57. යන්ත්‍රාන්සාරයෙන් රෙදි විවීම | 500.00 | 750.00 | 1000.00 |
| 58. අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත ඇසිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 59. උළු නැපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 60. පොහොර, හුණුපිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 61. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොග් ගල් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |

## අන්තරාදායක ව්‍යාපාර

| | | | |
|---|---|---|---|
| 1. කළුගල් කැණීම හෝ කැඩීම | 500.00 | 750.00 | 1000.00 |
| 2. එළවළු තෙල් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 3. පොල්තෙල් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 4. ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 5. මෙතිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 6. තේ පෙට්ටි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 7. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 8. කොහු හෝ වෙනත් කෙඳ වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 9. පිදුරු තබාගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 10. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 11. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම | 500.00 | 750.00 | 1000.00 |
| 12. හිර්ගල් හෝ හුණු ගල් කැණීම | 500.00 | 750.00 | 1000.00 |
| 13. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 14. හිස් ගෝනි හෝ හිස් බෝතල් තබාගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 15. පාපැදි හෝ යතුරුපැදි අළුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 16. පාවිච්චිකරන ලද කඩදාසි හෝ පත්තර තබාගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 17. විසිරි පින්තාරු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 18. ගිනිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 19. ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ උපකරණ නිපදවීම) | 500.00 | 750.00 | 1000.00 |

**අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර**

| | | | |
|---|---|---|---|
| 1. තලාතු මිණිරන් සුද්ධ කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 2. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙදි වර්ග සකස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 3. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම | 500.00 | 750.00 | 1000.00 |
| 4. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 5. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 6. තෙල් හෝ සත්ව මේද නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 7. හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම | 500.00 | 750.00 | 1000.00 |
| 8. ගිණිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 9. මෝරතෙල් සකස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 10. බෝට්ටු තැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 11. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 12. ලෝහ වර්ග පෑස්සවීම | 500.00 | 750.00 | 1000.00 |
| 13. මෝටර් වාහන අළුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 14. මෝටර් වාහන සේවා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 15. යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 16. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 17. බෙලෙක් වැඩපොලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 18. මෝටර් වාහන බෝඩි සෑදීම | 500.00 | 750.00 | 1000.00 |
| 19. කෘමිනාශක, දිලීර නාශක, පැළෑටි නාශක හෝ පළිබොධ නාශක නිපදවීම හෝ නැවත පිරවීම | 500.00 | 750.00 | 1000.00 |
| 20. විෂබීජ නාශක නිපවීම | 500.00 | 750.00 | 1000.00 |
| 21. මදුරු දගර නිපවීම | 500.00 | 750.00 | 1000.00 |
| 22. ප්ලාස්ටික් කුඩුකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 23. පරණ යකඩ එකතුකිරීම සහ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 24. බොරළු කැපීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 25. වැලි සේදීමේ ස්ථානයක් (පස් සේදීමෙන් වැලි ලබාගැනීමේ) පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 26. එල් පී ගෑස් ගබඩාකිරීම හා අලවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව,2026 වර්ෂය සඳහා කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාල අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-16) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/04/05/16 දරණ යෝජනාව**
**2026 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් හා 151 වගන්තියෙන් අලව්ව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උප ලේඛණයෙහි 1 වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන්, එම උප ලේඛණයෙහි 11 වන තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවෙ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී බද්ද 2026 අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත්අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| 1 වන තීරුව | 11 වන තීරුව | | |
|---|---|---|---|
| කර්මාන්තයේ ස්වභාව | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750/- නොඉක්මවන අවස්ථාවක | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750/- ඉක්මවන එහෙත් රු.1500/- නොඉක්මවන අවස්ථාවක | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1500/- ඉක්මවන අවස්ථාවක |
| 1. වීදුරු උපයෝගී කරගන්නා භාණ්ඩ නිපදවීම සඳහා | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2. | වෙස්මුහුණු කැපීම සහ විකිණීම සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 3. | බ්‍රේක් ලයිනර් නිපදවීම සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 4. | සපත්තු නිශ්පාදනය කිරීම සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 5. | මැටි භාණ්ඩ නිශ්පාදනය සහ අලවිකිරීම සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 6. | ඇඳුම් මහන ස්ථානයක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 7. | හඳුන්කූරු නිශ්පාදනය කිරීමේ ස්ථානයක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 8. | කොහුලණු ඇඹරීමේ ස්ථානයක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 9. | රෙදි පාපිසි නිෂ්පාදනය සහ අලෙවිය සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 10. | පපඩම් නිශ්පාදනය සහ අලෙවිය සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 11. | සුරුට්ටු සහ බීඩි නිශ්පාදනය සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 12. | යකඩ කම්මලක් පවත්වාගෙන යාම සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 13. | කපු පුළුන් නිපදවීම හා ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | කම්බි ඇණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | පිත්තල භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 16. | පැස්ටල් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 17. | කඩදාසි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 18. | මෙට්ටා නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 19. | ගල් ස්මාරක සාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 20. | සයිලන්සර් සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 21. | කජු මද සකස් කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 22. | පැලට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 23. | බිම්මල් වගාව පැකට් කිරීම සහ අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 24. | පරිඝනක මෘදුකාංග නිෂ්පාදනය කිරීමේ සහ අලවික්රීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2026 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**<u>(05-17) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව</u>**
**<u>අංක 07/04/05/17 දරණ යෝජනාව</u>**
**<u>2026 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම.</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ අලව්ව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ, හා වෘත්තියක් නොවන්නා වූ යම් ව්‍යාපාරයක් අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2026 වර්ෂයේ ආදායම මෙහි පහත පළමු උපලේඛණයෙහි 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී 11 වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුය. එකී බද්ද 2026 අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

<u>උපලේඛනය 1</u>

| <u>1 වන තීරුව</u><br><u>බද්ද අදාල වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ආදායම</u> | <u>11 වන තීරුව</u><br><u>ගෙවිය යුතු බද්ද</u><br><u>රු. ශත</u> |
|---|---|
| 1. රු. 6000 නොයික්මවන අවස්ථාවක | නැත |
| 2. රු. 6000 ඉක්මවන එහෙත් 12,000 නොඉක්මවන අවස්ථාවක | 90.00 |

3. රු. 12,000 ඉක්මවන එහෙත් 18,750නොඉක්මවන අවස්ථාවක 180.00
4. රු. 18,750 ඉක්මවන එහෙත් 75,000 නොඉක්මවන අවස්ථාවක 360.00
5. රු. 75,000 ඉක්මවන එහෙත් 1,50,000 නොඉක්මවන අවස්ථාවක 1,200.00
6. රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක 3,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2026 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**<u>(05-18) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/04/05/18 දරණ යෝජනාව</u>**

**<u>ප්‍රවාහන පහසුකම් සැපයීම සම්බන්ධවයි.</u>**
ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19(1) (XXXII) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 132 (ච) වගන්තිය ප්‍රකාරව, අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන පරිපාලන නිලධාරි, එම්.පී.සී.රේණුකා මහත්මිය හට රාජකාරියට වාර්තා කිරීමේදී, රාජකාරී ගමන්වල යෙදීමේදී සහ ආපසු නිවසට යාමේදී සහා අරමුදලින් ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව සම්බන්ධයෙන් අපේ කිසිම විරෝධතාවයක් නැහැ. නමුත් ඒ සම්බන්ධව ගැටලුවක් තියනවා. කරුණු පැහැදිලි කිරීමක් අවශ්‍යයි. ගරු සභාපතිතුමා විසින් ගෙන එනු ලැබූ යෝජනාවෙහි 19(1) (XXXII) සහ 132 (ච) යන වගන්තිවලින් බලතල හා කාර්යයන් ඉටු කිරීමේදී කියලා පැහැදිලිව තියනවා .නමුත් 1999 අංක 22 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි ප්‍රවාහන පහසුකම් ලැබිය යුතු රජයේ නිලධාරීන් කවුරුන්ද යනවග පැහැදිලිව හඳුන්වා දී තිබෙනවා. එහි ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුර ඇතුළත් වෙලා නැහැ. ඒ වගේම ප්‍රවාහන පහසුකම් සැපයිය යුත්තේ කෙසේද යන වග ආයතන සංග්‍රහයේද සඳහන් වෙනවා. මේ සියල්ල සලකා බැලීමේදී මෙතුමිය රාජකාරියට වාර්තා කිරීමේදී හා ආපසු නිවසට යාමේදී ප්‍රවාහන පහසුකම් සැපයීම සම්බන්ධව මට ගැටලුවක් මතුවෙනවා. 2025.07.30 වන දින නාරම්මල ප්‍රාදේශීය සභාවේ වැඩමුළුවක් තිබුණා. එම වැඩමුළුවේදී, සභාවේ ලේකම්තුමියට ප්‍රවාහන පහසුකම් සපයනවා නම්, රාජකාරිය සඳහා පමණක්ද, නිවස බලා ඒමට සහ යාමට ප්‍රවාහන පහසුකම් ලබා දීමේදී යම්කිසි විගණනයකදී හෙළිදරව් වුණොත් මේක අධිභාරයක් ලෙස සියලු මන්ත්‍රීවරුන්ගෙන් අය කර ගැනීමට සිදුවෙන බවට සඳහන් කලා. මේ සම්බන්ධයෙන් කිසිදු විරුද්ධතාවයක් නැහැ. මෙතුමිය ලොකු කැපකිරීමක් කරනවා නමුත් මේක නීත්‍යානුකූල විය යුතුයි. මේක මහ සභාවෙන් ගනු ලබන තීරණයක් නිසා මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන් වගකිය යුතු වෙනවා. ඒ අනුව රාජකාරියට වාර්තා කිරීමේදී හා ආපසු නිවසට යාමේදී කියන කාරණා දෙක මේ නීති රාමුව තුළ ආවරණය වෙනවද කියලා දැන ගැනීම අවශ්‍ය වෙනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා,තුමියන්ලා මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීම සඳහා යෝජනා කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙම මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා මෙතක් පැවති කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීම සඳහා යෝජනා කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙතෙක් පැවති කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීම කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 1990 ගාමිණී ගුණදාස සභාපතිතුමාගේ කාලයේ රටටම බලපෑ ගැටුමක් දඹදෙණි ආසනයේ නාරම්මල අලව්ව ප්‍රාදේශීය සභාවේ ඇති වුණා. ප්‍රාදේශීය සභාව සඳහා වෙනම ලේකම්වරයෙක් පත් කිරීම සඳහා විෂය භාර අමාත්‍යවරයාත් සමඟ සාකච්ඡා කරලා රාජ්‍ය පරිපාලන ඇමතිතුමාට තීන්දුවක් ගන්න සිද්ධ වුණා. ඊට පස්සේ තමා ප්‍රාදේශීය සභාවක ලේකම්වරයෙක් පත් කළේ. එලෙස පත්වුණ දවසේ සිට වාහන පරිහරණය කරන්න මහසභාවෙන් අනුමැතිය ලබා දුන්නා. ඒවා අවභාවිතා කරනවාද යන්න අධීක්ෂණය කිරීමේ වගකීම තියෙන්නේ ගරු සභාපතිතුමාටයි. මම විශ්වාස කරනවා, හිටපු නාවික හමුදාවේ නිලධාරියෙක් වශයෙන් ප්‍රියන්ත මන්ත්‍රීතුමාට මේ සම්බන්ධව පැහැදිලි කිරීමක් අවශ්‍ය වුණේ කියලා. ඒක සාධාරණයි. දේශනවලින් සිදුකරන්නේ අපිව බිත්ති හතරකට හිරකරන එකයි. වළකුඹුරේ ජයතිස්ස කියලා සහකාර කොමසාරිස් මහත්තයෙක් හිටියා. එයා නීතිය ඔක්කොම කියලා දීලා ඒ හරහා යා හැකි මාර්ගයත් කියලා දුන්නා. නැත්නම් ජනතාවට සේවය කිරීම අපහසුයි. යම් අවස්ථාවක ජන ජීවිතයට ප්‍රශ්නයක් වෙන සිදුවීමක් සිදු වුවහොත් ඒ සම්බන්ධව රාජකාරීමය වශයෙන් සාකච්ඡා කිරීම සඳහා මහ රෑ 12 ට හෝ මහ සභාව රැස් කරන්න සිදුවෙනවා. ඒ අවස්ථාවේ සභාපතිතුමාගේ නිල රථය යවලා හරි ලේකම්තුමිය ගෙන්නන්න වෙනවා. ඉතින් අසනීප තත්වයේ පසුවෙමින් ලේකම්තුමිය විශාල රාජකාරියක් සිදුකර නිලධාරිනියක්. ඒ නිසා නිලරථය භාවිතා කිරීම සම්බන්ධව අපේ කිසිදු විරෝධතාවයක් නැහැ කියලා ප්‍රකාශ කරමින් එය ලබා දීමට සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මේ සම්බන්ධව වැරදියට වටහා ගන්න එපා. ලේකම්තුමියගෙන් පැහැදිලි කිරීමක් අවශ්‍ය නිසයි මහ සභාවට මේ පිළිබඳව යොමු කළේ. මහ සභාවේ සියලු දෙනා එකඟ නම් මොහාන් මන්ත්‍රීතුමා විසින් සිදු කළ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ලේකම්තුමියට ලබාදෙන ප්‍රවාහන පහසුකම් පිළිබඳ මෙපමණ කාලයක් සාකච්ඡා කළ ප්‍රථම අවස්ථාවයි. නීතිය ඇතුළේ හිටියොත් කිසිම වැඩක් කරන්න වෙන් නැහැ. හැම මොහොතේම නීතිය සමඟ ගැලපීමක් සිදු කළ යුතුයි. රීති සහ චක්‍රලේඛවලට ඉහළින් පනත තියෙන්නේ. මේ සම්බන්ධයෙන් මෙතෙක් අධිභාරයක් වෙලත් නැහැ වෙන්නෙත් නැහැ. අනිත් අය කැමති වුණත් අධිභාරයක් වෙනවා නම් මම කැමති වෙන්නෙත් නැහැ, ඒ සම්බන්ධව මගේ විරෝධතාවය ගොනු කර ගන්න කියලත් කියනවා. මෙම නිලධාරී මණ්ඩලයට පහසුකම් දීලා තියෙන්නේ මානසික ඒකාග්‍රතාවයකින් රාජකාරිය සිදුකරන්න ඕනි නිසයි. යම් මොහොතක නීති රාමුව තුළ යෝජනාවක් ඉදිරියට ගෙනියන්න බැහැ කියලා නිලධාරීන් ප්‍රකාශ කරනවා නම් ඒකත් අපි පිළිගන්න ඕනි. රාජ්‍ය පරිපාන සේවය පිළිබඳ උපාධි අපිට නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි නීති පොත පෙරල ගත්තොත් වැඩ කරන්න හම්බෙන් නැහැ. මහජන සේවය සඳහා නීතිය ගලප ගන්න ඕනි. නිලධාරියා සහ මහජන නියෝජිතයා ගඟට පොත්ත වගේ. ගඟේ ඉවුරු දෙක වගේ ඉවුරක් ඛාදනය වෙලා පිටාර ගැලුවොත් ව්‍යවසන ගොඩකට මුහුණ දෙන්න සිදුවෙනවා. සභා බල ප්‍රදේශයේ ජනතාවට යම් සේවයක් ඉෂ්ට කරන්න අපි දෙගොල්ලෝ එකට එකතු වෙලා සාමූහිකත්වයෙන් වැඩ කරමුයි කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කරනවා නීතියට කටයුතු කරන්න බැහැ කියලා. නීතියට කටයුතු නොකරපු ගණනාවකට අවුරු 16,20,25 සිරගෙවල්වල ඉන්න වෙලා.
ඒ නිසා, 19 (1) (XXXII) වගන්තියට අනුකූලව අදාල චක්‍රලේඛවලට යටත්ව පමණක් සියලු නිලධාරීන්ට තියන පහසුකම් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මන්ත්‍රීතුමා ප්‍රකාශ කළේ නීතියට පටහැනි කියලා නීතියට කිසිදු පටහැනි ක්‍රමයක් නැහැ. සභා තීන්දුවකට තමා එකඟ වෙන්නේ. හොඳ උදාහරණයක් අපිට තියනවා.

හිටපු සභාපතිතුමියගේ කැබ් රථය වැවට පෙරලුණු අවස්ථාවෙහි ආණ්ඩු පක්ෂයක් විදිහට කිසිම වෙලාවක සභා අරමුදලින් මේ කැබ් එක හදන්න අනුමැතිය ලබා දුන් නැහැ. යම් නීතියකට යා යුතුයි, නරක දේට අපි විරුද්ධයි. නමුත් මේක මානුෂීය ප්‍රශ්නයක්. මෙතුමිය විනෝද ගමනක් ගියොත් ධාවන සටහන් පරීක්ෂා කරමින් අපි විරුද්ධ වෙලා ඊට අනුමැතිය ලබා දෙන්නැහැ. ඒ නිසා මෙතුමියට ප්‍රවාහන පහසුකම් ලබා දිය යුතුයි කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද මාල් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අපි ලේකම්තුමියට ප්‍රවාහන පහසුකම් දීම සම්බන්ධව විරුද්ධතාවයක් නැහැ. රාජ්‍ය නිලධාරීන් සමඟ සබඳතාවයන් ගොඩ නගා ගත යුත්තේ කොසේ ද යන වග ජනාධිපතිතුමා, අනුර සහෝදරයා අපිට පැහැදිලි කරලා තියනවා. රාජ්‍ය නිලධාරීන් සමඟ සහසම්බන්ධතාවය ගොඩ නගන්නේ කොහොමද කියලා අපි දන්නවා. නීතිය ඇතුළේ මේක කොහොමද කරන්නේ කියලයි අපි අභියෝගයකට ලක් කළේ. ජාතික ජන බලවේගයේ කණ්ඩායම විදිහට ලේකම්තුමියට ප්‍රවාහන පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් විරුද්ධතාවයක් නැහැ. සභාපතිතුමා නොමැති අවස්ථාවක සියලු රාජකාරි කටයුතු සොයා බලමින් ආවරණය කරන්නේ ලේකම්තුමියයි. ප්‍රියන්ත මන්ත්‍රීතුමා අභියෝගයකට ලක් කළේ පනත හා චක්‍රලේඛ පමණයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, පනත අනුව වගන්තියක් සම්බන්ධ කරමින් මෙම යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නේ. ලේකම්තුමියට විරුද්ධතාවයක් ඉදිරිපත් කරා නම්, ගරු සභාපතිතුමාටත් නිලරථය භාවිතා කිරීම සම්බන්ධව අනුමැතියක් ගන්න වෙනවා. එහෙම කරන්න බැහැනේ. අපි මේ සියලු දේවල් ගලපගෙන සහෝදරත්වයෙන් ඉදිරියට යමුයි කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා, මේ සභාවේ විශේෂත්වයක් තියෙනවා. බහුතරයක් ඉන්නේ නවක මන්ත්‍රීවරු. අත්දැකීම් සහිත ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු කීපදෙනයි ඉන්නේ. අත්දැකීමක් ගන්න සභා වාර තුනයි තිබුණේ. මටවත් ලේකම්තුමියටවත් පෞද්ගලික අවශ්‍යතා සඳහා සභා වාහන භාවිතා කරන්න බැහැ. අපිට සභා වාහන භාවිතා කරන්න හැකියාව තියෙන්නේ රාජකාරී මට්ටමින් පමණයි. අනිත් රාජ්‍ය ආයතනවලින් සභා කටයුතු පිළිබඳ යම් අදහසක් දීලා තියනවා. ඒ සම්බන්ධව විසඳා ගැනීමක් ප්‍රියන්ත මන්ත්‍රීතුමාට අවශ්‍ය වුණා. ඒ නිසා කවුරුත් වැරදි වැටහීමක් ඇති කර ගන්න එපා. සියලු මන්ත්‍රීවරුනි මේ කාරණාව සම්මත කර ගැනීම සඳහා කටයුතු කරමු

ඒ අනුව ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19(1) (XXXII) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 132 (ච) වගන්තිය ප්‍රකාරව, අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන පරිපාලන නිලධාරි, එම්.පී.සී.රේණුකා මහත්මිය හට රාජකාරියට වාර්තා කිරීමේදී, රාජකාරී ගමන්වල යෙදීමේදී සහ ආපසු නිවසට යාමේදී සභා අරමුදලින් ප්‍රවාහන පහසුකම් සැපයීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

<u>**(05-19)ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව**</u>
<u>**අංක 07/04/05/19 දරණ යෝජනාව**</u>
<u>**අලව්ව ප්‍රාදේශීය සභාව සඳහා ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් (MRF) ඉදි කිරීම**</u>

උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අංක PL/15/03/MRF/NWP/Alawwa PS හා 2025.07.28 දිනැති රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ලිපිය මඟින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ රු.24,243,532.10 ක මුදල් ප්‍රතිපාදන අනුමත වී ඇති බව දන්වා ඇති අතර, එම ව්‍යාපෘතිය බෝයවලාන පුස්තකාලය පවතින ප්‍රාදේශීය සභා භූමියේ ඉදි කිරීමට යෝජිතව ඇත. ඒ අනුව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා භාෂා ත්‍රිත්වයෙන්ම පුවත්පත් දැන්වීම් පලකර මිල ගණන් කැඳවීම සිදු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව බෝයවලාන පුස්තකාලය පවතින ප්‍රාදේශීය සභා භූමියේ ඉදි කිරීමට යෝජිත ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් (MRF) ඉදි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා භාෂා ත්‍රිත්වයෙන්ම පුවත්පත් දැන්වීම් පලකර මිල ගණන් කැඳවීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**<u>(05-20) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව</u>**
**<u>අංක 07/04/05/20 දරණ යෝජනාව</u>**
**<u>රෝග නිවාරණ කමිටුව පත්කර ගැනීම -2025</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් සභාවට උපදෙස් දීම පිණිස 2025 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාවේ රෝග නිවාරණ කමිටුව සඳහා සභිකයන්ගෙන් කොටසක් හෝ කොටසක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සහ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් කමිටුව පත් කිරීම සහ පහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

1. ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා -කමිටු සභාපති
2. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය -කමිටු සාමාජික
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා -කමිටුසාමාජික
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා -කමිටු සාමාජික
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය -කමිටු සාමාජික
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා -කමිටු සාමාජික
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. චමින්ද මාල්මැතිතුමා -කමිටු සාමාජික
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා -කමිටු සාමාජික
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා -කමිටු සාමාජික
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා -කමිටු සාමාජික
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා -කමිටු සාමාජික
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා -කමිටු සාමාජික
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා -කමිටු සාමාජික
14. එම්.ඒ.ජී.ජී.ආර්. සමීර රණතුංග මහතා, 471, පිලවතුර, මහරච්චිමුල්ල -කමිටු සාමාජික
15. ආර්.ඒ. උමේෂ් චින්තක ජයසිංහ මහතා. සංවර්ධන නිලධාරී , මලඇලවත්ත, ගලතරය, අලව්ව -කමිටු සාමාජික
16. ඩබ්.ඒ.ජී. වීරසේකරමහතා, ශ්‍රී ලංකා ගුරු සේවය(විශ්‍රාමික) ,දොඩම්කුඹුරවත්ත,අලව්ව -කමිටු සාමාජික
17. ජේ.එච්.කරුණා ජයමහ මිය,විශ්‍රාමික ජ්‍යේෂ්ඨ පරිපාලන නිලධාරී, නන්දන,පරමාඋල්ල,අලව්ව -කමිටු සාමාජික
18. එම්.පී.සී.රේණුකා මිය,ලේකම්, ප්‍රාදේශීය සභාව, අලව්ව -කමිටු සාමාජික
19. එච්.එම්.එච්. හේරත් මිය, සංවර්ධන නිළධාරි, ප්‍රාදේශීය සභාව,අලව්ව -කමිටු ලේකම්
20. කේ.ඒ.අයි.සමන්ලතා මිය, ප්‍රජා සංවර්ධන නිළධාරි, ප්‍රාදේශීය සභාව, අලව්ව -කමිටු සාමාජික
21. ජේ.එම්.ඩී.ජයකඩු මිය,පරිසර නිළධාරී, ප්‍රාදේශීය සභාව, අලව්ව -කමිටු සාමාජික
22. ඩබ්.ඒ.සී.ජේ. වික්‍රමආරච්චි මිය, සංවර්ධන නිලධාරී, ප්‍රාදේශීය සභාව, අලව්ව -කමිටු සාමාජික
23. ඩබ්.එම්.ඒ.බී. වනසිංහ මහතා, පරිපාලන මහ.සෞ.පරී., සෞ.වෛ.නි. කාර්යාලය,අලව්ව -කමිටු සාමාජික
24. එස්.එන්.එල්.එස්. වික්‍රමසිංහ මහතා, මහ.සෞ.පරීක්ෂක,සෞ.වෛ.නි. කාර්යාලය,අලව්ව -කමිටු සාමාජික
25. එම්.එච්. මුතුකුමාරණ මහතා, ප්‍රජා පරිසර නිලධාරී, අලව්ව පොලිස් ස්ථානය -කමිටු සාමාජික
26. වයි.එම්.ජී.එස්. යාපා මහතා, පොලිස් සැරයන්,බෝයවලාන පොලිස් ස්ථානය -කමිටු සාමාජික
27. ඩබ්.ඒ. සංජීවනී වර්ණසූරිය මිය, පරිසර නිළධාරී ,පොල්ගහවෙල පොලිස් ස්ථානය -කමිටු සාමාජික
28. එච්.ඩී.ඩබ්. ශ්‍රීනාත් මහතා, පරිසර නිලධාරී , ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අලව්ව -කමිටු සාමාජික

<u>රෝගනිවාරණ සම්බන්ධයෙන් වූ කමිටුවට පැවරී ඇති බලතල -</u>

1. බල ප්‍රදේශයේ ව්‍යාප්ත වන බෝවන රෝග හා බෝ නොවන රෝග මර්දනය කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් නිර්දේශ කර මහ සභාවට යොමුකර කිරීම.
2. බල ප්‍රදේශයේ ව්‍යාප්ත වන බෝවන රෝග හා බෝ නොවන රෝග මර්දනය කිරීම සඳහා බාහිර ආයතනවල සහයෝගය ලබාගැනීම.
3. රෝග මර්දන වැඩසටහන් වල ප්‍රගතිය පරීක්ෂා කර මහ සභාව වෙත වාර්තා කිරීම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද මාල් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය ප්‍රකාරව ඉහත සඳහන් කාරණා සම්බන්ධයෙන් සභාවට උපදෙස් දීම පිණිස 2025 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාවේ රෝග නිවාරණ කමිටුව සඳහා සභිකයන්ගෙන් කොටසක් හෝ කොටසක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සහ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත ඉහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් කමිටුව පත් කිරීම සහ ඉහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>(05-21) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව</u>**
**<u>අංක 07/04/05/21 දරණ යෝජනාව</u>**
**<u>ජගත් වැඩිහිටි දින උත්සවය-2025</u>**

අලව්ව ප්‍රාදේශීය සභාව විසින් ජගත් වැඩිහිටි දිනයට සමගාමීව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් ආයුර්වේද සායන හා අක්ෂි සායන වැඩ සටහන් 04ක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති අතර , මේ සඳහා වැය ශීර්ෂ 06-06-607-9 යටතේ රු. 100,000.00 ක මුදලක් වැය දැරීමට සහ වැඩ සටහන පැවැත්වීමටත් අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**<u>ජගත් වැඩිහිටි දින උත්සවය - 2025</u>**
<u>වැය ඇස්තමේන්තුව</u>

| අංකය | වැඩසටහන් විස්තරය | ඒකකයයේ වටිනාකම රු. ශත | ප්‍රමාණය | මුදල රු. ශත |
|---|---|---|---|---|
| 01 | ආයුර්වේද අක්ෂි සායන කඳවුරු 04ක් පැවැත්වීම<br>1. උඩගන්කන්ද<br>2. නුගවෙල<br>3. දමුණුපොළ<br>4. හෙණ්ඩුවාවත්ත/හෙණ්ඩුවාව | | 400 | |
| 02 | අක්ෂි පරීක්ෂාව සහ උපදේශනය | | 400 | |
| 03 | බෝ නොවන රෝග පිළිබඳ දැනුවත් කිරීම හා ආයුර්වේද සායනය | | 400 | |
| 04 | හැකියාවන් හා දක්ෂතා ඉදිරිපත් කිරීම | | 20 | |
| 05 | සංග්‍රහකටයුතු | 200.00 | 400 | 80,000.00 |
| 06 | " ජීවිතයේ සැදෑ සමය නිරෝගීමත්ව ගත කිරීම"යන මැයෙන් සිදු කරන දේශන සඳහා සම්පත් දායක දීමනාව | 5,000.00 | 04 | 20,000.00 |
| මුළු එකතුව | | | | **100,000.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජී. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2025 වර්ෂයේ ජගත් වැඩිහිටි දිනයට සමගාමීව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් ආයුර්වේද සායන හා අක්ෂි සායන වැඩ සටහන් 04ක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති අතර , මේ සඳහා වැය ශීර්ෂ 06-06-607-9 යටතේ රු. 100,000.00 ක මුදලක් වැය දැරීමට සහ වැඩ සටහන පැවැත්වීමටත් අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-22) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව**

**අංක 07/04/05/22 දරණ යෝජනාව**

**ප්‍රාදේශීය සභා මාර්ගයේ බොරළු ප්‍රවාහනය සඳහා අවසර ලබා ගැනීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2025.07.21 දින මහරච්චිමුල්ල , විල්ගමුව ලිපිනයේ පදිංචි ජී.පී.අයි.ඩී. පතිරණ මහතා විසින් ලිපියක් යොමු කර ඇත. එම ලිපියෙහි භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් I.M.C/DH/N/17897 අංක දරණ කැනීම් බලපත්‍රයක් ලබා ගෙන ඇති බවත්, එම බලපත්‍රය අයිති ඉඩමේ සිට ප්‍රාදේශීය සභා මාර්ගය භාවිතා කර බොරළු කියුබ් 03ක ටිපර් රථ ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙස සඳහන් කර ඇත.

අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් විල්ගමුව හීන්න කන්ද මාර්ගයේ සිට කැබැල්ලගොල්ලහරහා විල්ගමුව මැටියගනේ දක්වා දිවෙන ප්‍රාදේශීය සභා මාර්ගයේ බොරළු ප්‍රවාහනය සඳහා වැඩ අධිකාරි මහතා විසින් පහත කොන්දේසි සහිත ගිවිසුමකට යටත්ව බලපත්‍ර ලාභියාට අවසර ලබා දීම සුදුසු බව වාර්තා කර ඇති අතර, ඒ අනුව පහත කොන්දේසි වලට යටත්ව මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

<u>කොන්දේසි :-</u>

1. දැනට භාවිතා කිරීමට යෝජිත මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කර ඇති කොටස් භාවිතයෙන් පසු යම්කිසි හානියන්ට පත් වුවහොත් ඒවා යථා තත්වයට පත්කර දිම.
2. මාර්ගයේ පවතින බෝක්කු, කාණු පද්ධතියට අලාභයක් සිදු වුවහොත් එම ස්ථාන අළුත්වැඩියා කර දිම.
3. ඉහත සඳහන් මාර්ගය භාවිතයේදී මාර්ග වලට හෝ බෝක්කු, කාණු පද්ධතියට අලාභ හානියක් සිදු වුවහොත් එය නැවත යථා තත්වයට පත් කිරීමේදී දැරිය යුතු සියළු වියදම් දැරීම සඳහා බැඳී සිටි යුතු අතර, අලව්ව ප්‍රාදේශීය සභාවට ඒ සඳහා වියදම් දැරිය නොහැකිය.
4. එසේ භාවිතයෙන් පසු හානියක් සිදු වූ ස්ථාන යථා තත්වයට පත්කර දීමට ප්‍රථම අප සභාවේ තාක්ෂණ නිලධාරී මගින් ස්ථානීය පරික්ෂාවක් සිදු කර එම ස්ථාන අළුත්වැඩියා කිරීමට කටයුතු කිරීම.
5. හීන්න කන්ද මාර්ගයේ සිට කැබැල්ලගොල්ල හරහා විල්ගමුව මැටියගනේ දක්වා දිවෙන ප්‍රාදේශීය සභා මාර්ගයේ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කර ඇති 103m දුරක ප්‍රමාණයට ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගය භාවිතා කිරීම සඳහා රු. 1,407,232.35 ක(රුපියල් දාහතර ලක්ෂ හත්දහස් දෙසිය තිස්දෙකයි ශත තිස් පහයි) තැන්පතුවක් අය කිරීම.
6. පාසල් ළමුන් මාර්ගයේ ගමන් කරන කාල සීමාව තුල බොරළු ප්‍රවාහනය නොකළ යුතුය

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව , ගරු සභාපතිතුමනි , හීන්න කන්ද මාර්ගය මාගේ කොට්ඨාශයට ආසන්නයේ තියෙන්නේ. රේඛීය අමාත්‍යාංශය යටතේ ලැබුණු ප්‍රතිපාදන නිසා මෙහි කොන්ක්‍රීට් අතුරන්න පටන්ගත්තා. අද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන මාර්ග පස් ඇදීම් සහ කැණීම් නිසා අබලන් වී තිබෙනවා. ගල්ගමුව- මහරච්චිමුල්ල මාර්ගය ඇතුළු ප්‍රාදේශීය සභා මාර්ගයන්වල ටොන් 5ට වඩා යන්න බැහැ කියලා PRDA එකෙන් ගහලා තියනවා. මේ කුමන ආකාරයකින් දැන්වීම් කළත් ටොන් තුන හමාරේ ටිපර්, ටෙන් වීල් වැනි වැඩි බරින් යුතු වාහන ගමන් කරනවා. මේ සඳහා කමිටුවක් හරහා හෝ අධීක්ෂණය කරලා ඒ කරුණු සලකා බලා ඉදිරියට අනුමැතිය ලබා දෙන්න කියලා මේ ගරු සභාවට මම ප්‍රකාශ කරනවා. මේවා රැක ගැනීම මහජන නියෝජිතයන් හැටියට අපේ යුතුකමක් වෙනවා. ඒ නිසා මීට වඩා අධීක්ෂණය කරන්න කියලා සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, සමහර පස් කපන ආයතන ප්‍රාදේශීය සභාවෙන් අවසර අරන් නැහැ. මේ පිළිබඳවත් සොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි , මීට කලින් බොරළු මෙන්ම කළුගල් සඳහාද තාක්ෂණික නිලධාරීන් ස්ථානීය පරික්ෂාවක් කරලා, කමිටුවක් හරහා මන්ත්‍රී මණ්ඩලයත් සමඟ සාකච්ජා කරලා, තැන්පතු ප්‍රමාණවත්ද යන්න තීරණය කරලා තමා අවසර දීලා තියෙන්නේ.

මෙම පුද්ගලයා කරන ඉල්ලීම අනුව, අපේ කාර්මික නිලධාරී මහත්වරුන් සමඟ ස්ථානීය පරීක්ෂණයක් සිදුකර තීන්දුවකට ඇවිත් තියනවා නම් ගැටලුවක් නැහැ. ගරු සභාපතිතුමනි, PRDA පාරවල් පරිහරණය කරනවා නම්, ඉදිරියට මේ සම්බන්ධව මහසභාවට යොමු කරන අතරේ කමිටුවක් පත් කරලා නිවැරදිව දුර මීටර් ප්‍රමාණ කීයද, වත්මන් තත්වය පිළිබඳව , මේ කොන්ක්‍රීට් එක අතුරන්න වුණොත් අතුරන්න යන මුදල කොපමණද කියලා අධීක්ෂණය කරලා ඒ මුදල සුරැකුම් වශයෙන් සභාවේ රඳවලා තමයි අපි මේකට අවසර දෙන්නේ. ඒ නිසා මේ සම්බන්ධව නැවත පරීක්ෂණයකට ගොස් මේ කියන මීටර් එකසිය ගාණක් දිග, අඩි 10 හෝ 12ක් පළල නම්, මේකේ පිපිරුමක් හෝ කැඩීමක් සිදු වුවහොත් යථා තත්වයට පත් කරන්නනේ කාර්මික නිලධාරී මහත්වරු මේ මුදල තීරණය කරලා තියෙන්නේ. නමුත් මේක දිගින් දිගටම හානියක් සිදු වුණොත් අපිට ඒ මුළු මුදලම යනවනේ ඒ නිසා මුළු මුදලම ඇපයක් හැටියට තැන්පතුවක් ලෙස සභාවේ රඳවගෙන මේක දෙන්න කියලයි මම මේ සභාවට යෝජනා කරන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමනි , මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කරන්න කියලා ඉල්ලා සිටින අතර, ප්‍රාදේශීය සභා මාර්ග සම්බන්ධයෙන් අවධානයට ලක්නොවුණු කාරණයක් තියනවා. ගස් පැටවීම සම්බන්ධව, එනම් ටොන් 18-20 බරින් යුතු කොට ලෝඩ් පැටවීම. දවසක් මට දුරකථන ඇමතුමක් දෙනවා කොහොලාන වසමේ කොට ලෝඩ් එකක් පටවනවා කියලා. එම අවස්ථාවෙහි ඒක වහාම නතර කරන්න කියලා කීවා. ව්‍යාපාරයක් කරන්න ඕනි හැබැයි අපේ සභා පාරවල් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තියෙන්නේ කියලා මම ග්‍රාම නිලධාරී මහතා ඇතුළු අවශ්‍ය අය දැනුවත් කරලා කීවා. ප්‍රදේශයේ මන්ත්‍රීවරයා හැටියට, පොඩි බූම් එකක් හරි ගෙනල්ලා කොට ටික පටවන්න කියලා ගම්වාසීන්ට මම යෝජනා කළා. මේ වගේ අවස්ථාවකදී ප්‍රාදේශීය සභා මාර්ගයන්හි කොට පටවමින් ධාවනය කරන විට බූම් එකක කොට පටවලා ගෙනියන එක තමයි සුදුසු වන්නේ. ඒ අනුව, සභා පාරවල කොට පැටවීමේදී ප්‍රදේශයේ ඉන්න මන්ත්‍රීවරු මේ පිළිබඳ සැලකිලිමත් වෙලා ඒ කටයුත්ත ඉෂ්ට කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද මාල් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, පතිරණ කියන මහතා මේ යෝජනාව ගෙනාවහම ඔහුගෙන් ලක්ෂ 14ක වගේ මුදලක් අය කර ගන්නවා. අපි දන්න තරමින් විල්ගමුව ප්‍රදේශයේ පස් කපන බොහෝ පිරිසක් ඉන්නවා. මෙහු නීතියක් එක්ක නීත්‍යානුකූලබාවය තහවුරු කරමින් සභාවත් සමඟ මේ ගනුදෙණුව ආරම්භ කරන කොටම ලක්ෂ 14කට ඔහු හිරවෙනවා. ඔහුට මුදල් ඇති. පස් සැපයුම්කරුවන්ගෙනුත් මේ වගේ ඇප මුදලක් තැන්පත් කරලා නිසි ක්‍රමවේදයකට සභාවේ පාරවල් භාවිතා කිරීම සඳහා නීත්‍යානුකූලබාවයක් ලබාගනිමින් අදාල කටයුතු සොයා බලමින් අවසර ලබා දෙන්න කියලා මම ඔබතුමාට යෝජනා කරනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීවරුනි, මේ කාරණයේදී, මේ දිනවල හීන්න කන්ද මාර්ගයේ කොන්ක්‍රීට් ඉදිකිරීමක් යන නිසා මෙම පුද්ගලයාට බොරළු ප්‍රවාහනය කිරීමට අවස්ථාව දෙන්න වෙන් නැහැ. පරිසර බලපත්‍රයේ තිබුණු උපදෙස් අනුව, සභාවට ඇවිත් අවසර ගැනීමට මැදිහත් වීමම මේ පුද්ගලයාගේ යහපත් ලක්ෂණයක්. මේ පිළිබඳව අදාල නිලධාරීන්ට යොමු කරලා මම ඒ තැනට ගියා. ඇත්තටම විල්ගමුව ප්‍රදේශයේ දිගට හරහට පස් කපනවා නමුත් ඒ පස් කපන හැමෝම සභා පාරවල් භාවිතා කරනවාද කියන්න මම දන්නැහැ. අපි පත් කරන කමිටුව තුළින් ඒ පිළිබඳවද අධීක්ෂණයට ලක් කළ යුතු අතර, ක්ෂණිකව නියාමනයකට ගමන් කළ යුතුයි. අනිත් පස් කපන අයත් සභා පාරවල් භාවිතා කරනවා නම් ඒ අයටත් මේ නීතිය ආදාළ වෙන්න ඕනි. මේ පුද්ගලයා සභාවට ආපු එකත් වටින නිසා කොහොම හරි සාධාරණයක් ඉෂ්ට කරන්න ඕනි. මේකට කමිටුවක් පත් කරලා දැනට කටයුතු කරනු ලබන අය අධීක්ෂණය කරමුයි කියලා ඉල්ලා සිටින අතර, අපි තීන්දුවක් ගන්න තැනට ඊළඟ මහ සභාව වෙනකොට ඉදිරිපත් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු කරන අවස්ථාවේ කමිටුව සඳහා එක් පාර්ශවයක් විතරක් නෙවේ බොරළු කපන පාර්ශවයත් සම්බන්ධ කර ගනිමින් ඒ අයගෙනුත් අදහසක් ගමු.

ඒ මිනිස්සුන්ගෙත් යෝජනා තියනවා. අපේ කෝණයෙන් පමණක් බලමින් තීන්දු තීරණ ගත්තහම ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා ඔවුනුත් නියෝජනය කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් හදන්න.

ඊළඟ කාරණාව, බලපත්‍රයක් ගත්තහම නීතියේ ඇතුළේ ඉන්න පුද්ගලයා තමා තලාපෙලා දාන්නේ කියලා මිනිසුන්ගේ මතයක් ගොඩ නැගිලා තියනවා. නමුත් බලපත්‍ර නැතුව හොරෙන් පස් කපන මිනිස්සු මේ කිසිම රාමුවකට නැහැ. එහෙම පිරිසත් ඉන්නවා. පරිසර හානිය, පාරේ වලවල් ඇතිවීම ආදිය සිදුවෙන්නේ එතනින්. නමුත් නීත්‍යානුකූල පරිසර බලපත්‍ර ගත්ත පුද්ගලයාගේ පමණක් ඉඩමට ගිහින් පියවරෙන් පියවර පස් කපලා ද කියලා පරීක්ෂා කරන්නේ එහෙම සිදු වෙලා නැත්තනම් පරිසර බලපත්‍රය අවලංගු කරනවනේ. නීත්‍යානුකූලව බලපත්‍ර ගත්ත පුද්ගලයා තමා සිර කරන්නේ. දෙවනි කාරණය තමා පොලිසිය සහ අදාල නිලධාරීන් සම්බන්ධ කරගනිමින් ඉඩමකට බලපත්‍රයක් ගන්නවා නමුත් ඔවුන් පවසන උපදෙස් අතැරලා ඔවුන් පස් කපන්නේ ඉඩම් දෙකක් එහා පැත්තේ. ඒ නිසා, නිසි ක්‍රමවේදයකට යමින් ඒ පිළිබඳවද අවධානය යොමු කරන්න කියලා ඔබ තුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රී තුමන්ලා තුමියන්ලා, මේ සම්බන්ධව ඉදිරියේදී ක්‍රියාත්මක වීම සඳහා කමිටුවක් පත් කර ගන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, පස් කැපීම සහ ප්‍රවාහනය සම්බන්ධව අධීක්ෂණය කිරීම සහ ඉදිරි කටයුතු සිදු කිරීමට අදාලව ගරු මන්ත්‍රී මණ්ඩලයේ,

I. ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
II. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
III. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
IV. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා
V. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා

ඇතුළු අලව්ව බල ප්‍රදේශයේ පස් කපන ව්‍යාපාරයට සම්බන්ධ පිරිසෙන් සැදුම්ලත් කමිටුව පත් කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපති තුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, බලපත්‍රලාභී විල්ගමුව ලිපිනයේ පදිංචි ජී.පී.අයි.ඩී. පතිරණ මහත්මියගේ ඉල්ලීමට අදාලව ඉහත කොන්දේසි සහිත ගිවිසුමකට යටත්ව රු. 1,407,232.35 ක මුදලක් (රුපියල් දාහතර ලක්ෂ හත්දහස් දෙසිය තිස්දෙකයි ශත තිස් පහයි) තැන්පතුවක් ලෙස අය කරමින්, අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් විල්ගමුව හීන්න කන්ද මාර්ගයේ සිට කැබැල්ලගොල්ල හරහා විල්ගමුව මැටියගනේ දක්වා දිවෙන ප්‍රාදේශීය සභා මාර්ගයේ කියුබ් 03ක ටිපර් රථ මගින් බොරළු ප්‍රවාහනය කිරීම සඳහා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**<u>(05-23) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව - අංක 07/04/05/23 දරණ යෝජනාව</u>**

**<u>2025 වර්ෂයේ සංවර්ධන යෝජන සංශෝධනය කිරීම.</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ප්‍රජා සංවර්ධන යෝජනා යටතේ ලෙව්දෙණිය ග්‍රාම නිලධාරී වසමට අයත් හඟවත්ත ග්‍රාමයේ දෙණියේ ළිද සංවර්ධනයට රු. 200000/- ක මුදලක් වෙන් කර ඇත. එහෙත් තාක්ෂණික නිලධාරීන්ගේ නිරීක්ෂණයට අනුව එකී ළිද සංවර්ධනය කිරීම එම මුදලින් සිදු කල නොහැකි බව නිරීක්ෂණය වන බවත්, එබැවින් එකී මුදල වඩුවාව කොට්ඨාශයේ පොරමඩල ග්‍රාම නිලධාරී වසමේ පරගහකොටුව පොදු ළිද සංවර්ධනයට ලබා දෙන මෙන් ගම්වාසීන් ඉල්ලා සිටින අතර , ඔවුන්ගේ අදහස වී ඇත්තේ එම මුදල මඟින් අමුද්‍රව්‍ය ලබා ගෙන ශ්‍රම දායකත්වය මඟින් මෙම කටයුතු සිදු කර ගැනීමයි.

ඒ අනුව අදාල මුදල, **පොරමඩල ග්‍රාම නිලධාරී වසමේ පරගහකොටුව පොදු ළිද** ගම්වැසියන්ගේ ශ්‍රම දායකත්වය මඟින් සිදු කර ගැනීම සඳහා ඉහත සදහන් ව්‍යාපෘතිය මේ සඳහා සංශෝධනය කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඉතාම හොඳ යෝජනාවක්. මෙම වැඩසටහන වෙනත් ස්ථානයකට ලබා දීම සම්බන්ධව අපේ සියලු දෙනාගේම එකඟතාවය ප්‍රකාශ කර සිටිනවා. නමුත් මම කරුණක් මතු කරන්න කැමති. 2025 වසරේ සභා අරමුදලින් මගේ කොහොලාන වසමේ කුඩුමුල්ල හරහා මැදිකැලේ වත්ත මාර්ගය සඳහා දීපු යෝජනාවෙහි, කොහොලාන බේකරියේ සිට ඉදිරියට දාන්න යෝජනාව කාර්මික සේවා කමිටුවේදී සම්මත කර ගත්තා. ඒත් ඒ යෝජනාව මේ වෙනකොටත් ඇතුළත් කරලා නැහැ. ඒ සම්බන්ධව ඔබතුමා දරන මතය මම දන්නැහැ. ගරු මන්ත්‍රීවරුන්ගේ අත්සනින් අද මම යෝජනාව ලිඛිතව ඉදිරිපත් කරලා තියනවා. මා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, අපි සියලු දෙනාම සභිකයෝ විදිහට මහජන ඡන්දයෙන් පත්වෙලා කොට්ඨාසය දිනපු මහජන නියෝජිතයා විදිහට ඔබතුමා ඒකට සාධාරණයකත් ඉෂ්ට කරයි කියලා. මම සභිකයෙක් විදිහට සහ මගේ අයිතිවාසිකමක් විදිහට මේ කටයුත්තට මගේ පාරත් ඇතුළත් කරලා දෙන්න කියලා නැවතත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි , මම මේ සභාවට තේරී පත් වුණේ පක්ෂ විපක්ෂ බේදයකින් තොරව. වැඩිම ඡන්ද ගත්ත රැල්ලෙන් නැතිව ශක්තියෙන් ආසනයෙන්ම වැඩිම ප්‍රතිශතයක් දිනාගත් මන්ත්‍රීවරයෙක් විදිහට මගේ කණගාටුව ප්‍රකාශ කරනවා. මගේ කොට්ඨාසයේ මිනිස්සු මාව දිනවලා එව්වේ ගමට වැඩ කරන්න. ගල්ගමුව කොට්ඨාසයේ ප්‍රාදේශීය නියෝජිතයා මම. වෙන නියෝජිතයෝ ඉන්නවද කියලා මම දන් නැහැ සභාපතිතුමා තමයි දන්නේ. දැනට වැඩ නිම කර ඇති ලක්ෂ 07 ක විතර හීන්න කන්ද මාර්ගයේ ව්‍යාපෘතිය විනිවිදභාවයෙන් තොරව සිදු කළ ඉතාම අසාර්ථක ව්‍යාපෘතියක් කියලා මම භය නැතිව කියනවා. මෙම ව්‍යාපෘතිය සිදු කළ ආකාරය පිළිබඳ එම ස්ථානයේ හිටපු පිරිස මට නොයෙකුත් තොරතුරු ලබා දුන්නා. එතන ස්ථානීය පරීක්ෂණයක් කරන්න. වැඩක් කරන කොට මේවා හොඳට කරන්න ඕනි .මේවා මහජන මුදල්. අධීක්ෂණයට කවුද හිටියේ කියලා මම දන් නැහැ. නිකමටත් මහජන නියෝජිතයා හැටියට අපිට මතක් කරන් නැත්තේ ඒවා හොරට කරන්න ඕන ඒවාද කියලා ම සැකයක් තියනවා. ඒවගෙන් කොමිස් ගන්නේ කවුද කියලා මම දන්නැහැ. ඊයේ ලක්ෂ විසි ගාණක විතර ව්‍යාපෘතියක් කරා. ඒ ප්‍රදේශයේ අය එම ව්‍යාපෘතිය හොඳයි කියලා කීවා. මම හොඳ දේත් හොඳයි කියනවා. සභාව ආරම්භයේදීත් අපිට ආරාධනා කළේ නැහැ අපිව අතැරුණා. අපි හරි සද්භාවයෙන් වැඩ කරන්නේ. ඒවගේම උද්ධාල මන්ත්‍රීතුමාගේ කොට්ඨාසයේ හේණ්ඩුවාවේ බෝක්කුවක් දාගන්න ඕනි කියලා කතා කරා මම හිටියේ පන්නල, එත් මම මගැරියේ නැතුව ඒකට සහභාගී වුණා. අපි ශක්තියෙන් ආපු අය මන්ත්‍රීතමාලා දන්නවා. සභාපතිතුමා හීන්න කන්ද මාර්ගයට අදාල ව්‍යාපෘතිය කරපු මිනිස්සුන්ට කියන්න, මුදල් ඉල්ලනකොට පරිස්සමින් ඉල්ලන්න කියලා. ආණ්ඩුවටත් හොඳ නැහැ. හැබැයි මා සමඟ ඡන්දය ඉල්ලපු ජාතික ජන බලවේගයේ අපේක්ෂකයා නොවේ. අපි ඇත්ත කියන්නේ. පිළිතුරු දෙන්නේ භය නැතුව. මම විපක්ෂයේ ඔක්කොටම කියලා තියෙන්නේ අර ව්‍යාපෘතියේ ගෙවීමවලට විරුද්ධයි. ඒකට සාධාරණ පරීක්ෂණයක් අවශ්‍යයි. අපි හොර වැඩ කරන්න කොහොමත් කැමති නැහැ. මම තුන්වෙනි පාරට දේශපාලනයට ආවේ. 2018 දී අපේ ආණ්ඩුව යටතේ මම කන්දෙගෙදර කොට්ඨාසයේ ප්‍රබල ජනතා විමුක්ති පෙරමුණේ පාර්ෂිකයෙකුගේ දරුවෙකුට රස්සාවක් දුන්නා. අපි කවදාවත් දේශපාලනය ඇඟේ ගහගත්තේ නැහැ. හිටපු දයාසිරි ජයසේකර මැතිතුමා ළඟම කෝටි ගණන වැඩ කරලා තියනවා අදත් කරනවා. ඒක සමාජයේ මිනිස්සු දකිනවා. කිසිම මිනිසෙකුට දේශපාලනයෙන් හිරිහැර කරන්න ගිහිල්ලා නැහැ. හැමෝම සමඟ හොඳයි. එත් මට කණගාටුයි. මගේ කොට්ඨාසයේ වැඩ කරනවා මම දන්නැහැ. ඒවා හොරට කරපු හොර ව්‍යාපෘති. අපි ඒවා තරයේ හෙලා දකිනවා. මේ ආණ්ඩුව වෙනස් කළෙත් මිනිස්සු නිකම් නෙමේ රට හොඳ තැනකට ගෙනියන්න. 2018 දී රටේ දේශපාලන රැල්ලක් තිබ්බා .අපි ඉල්ලුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්. අපි දිනුවා. ඒකේ හිටියා පොහොට්ටුවේ මන්ත්‍රීවරු 15 ක් ඒකෙන් දිනුවේ අතුකොරාල මන්ත්‍රීතුමා විතරයි. නාරද මන්ත්‍රීතුමා සජබෙන් ආවා. දේශපාලනය හරි වෙනස්. ගෝඨාභය ගෙදර යයි කියලා හිතුවද ඒ දේශපාලන සංස්කෘතිය තුළ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති වෙයි කියලා හිතුවද. දේශපාලනය හරි අමුතු දෙයක්. මින් ඉදිරියට මේ සභාවේ වැඩ කරද්දී හැමදෙනාටම ගෞරවයක් තියෙන්න ඕනි. ඔබ තමුන්නාන්සේලාටත් 13 ක් ඉන්නවා අපිටත් 13 ක් ඉන්නවා රීතිවලට ඉන්දවලා ඉන්නවනම් රීතිවලටත් වැඩ යන්න ඕනි. ඔබතුමා කියනවා හැම මන්ත්‍රීතුමෙක්ම එකයි කියලා ඒත් මෙතන කොටසකට වෙනස්කම් තියනවා ඒක හොඳ නැහැ. අපි සද්භාවයෙන් වැඩ කරන මිනිස්සු කවදාවත් අසාධාරණ වැඩ කරන් නැහැ. ඒ නිසා මේ වැඩේ කරන්න එපා සභාපතිතුමා ඡන්දය දිනලා, කොහෙවත් ඉන්න ඉදිගොව්වෝ හෝ කත්කඩියෝ ගණන් ගන්නෙත් නැහැ ඔහොම වැඩ කළාම තියන ඡන්දත් නැති වෙනවා.

ඒ නිසා හොරාට හොරාමයි කියන්නේ. අපේ විපක්ෂයේ සියලු දෙනාම කතා කරලා තියෙන්නේ ගෙවීම්වලට විරුද්ධයි. ලක්ෂ 07ක් තියෙන්නේ. ගල් වැඩිය තිබ්බලු වැඩ කරන මිනිස්සු වැඩේ කරන්න බැහැ කීවා. පාන්දර 02 ට විතර කොන්ක්‍රීට් දාන සංස්කෘතියක් මම දැකලාම නැහැ. හොර වැඩ කරන්න පාන්දර දාන්නේ ඒක නිසා මේ වංචාවට අපි විරුද්ධයි. ඔබ තමුන්නාන්සේලාත් පක්ෂ විපක්ෂ 26 දෙනාම විරුද්ධයි. ඔබ තුමාට පුළුවන් නම් කොට්ඨාසයේ යම් ව්‍යාපෘතියක් වැඩක් යනවනම් අපිවත් දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා. නැත්තනම් හොර වැඩ කරද්දී ඔබතුමත් අනුගත වෙලා කියලා හිතයි, ඔබතුමා එහෙම කරන් නැහැ කියලා දන්නවා. නමුත් අපිට අවස්ථාවක් නොදීමම ප්‍රශ්නයක්. එහෙම නොහැකි නම් ගැටළුවක් නැහැ. ඔබ සැමට සුභ පතමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද මාල් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මේ පිළිබදව ගරු මන්ත්‍රීතුමා , මගේ මිත්‍රයා අදහස් දැක්වීම ඉතා හොදයි. මෙම ව්‍යාපෘතියේ ඔය කියන විදිහට වංචාවක් සිදු වෙලා තියෙනවා නම් එය ලිඛිතව සාක්ෂි සහිතව ගරු සභාපතිතුමාට ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. එතකොට අදාල ක්‍රියාමාර්ගවලට යන්න පුළුවන්. බොහොම සන්තොෂයි . ඔබ තුමා වැනි කෙනෙක් මේ පිළිබදව මැදිහත්වෙලා එතන වංචාව දූෂණය දැකීම සම්බන්ධව. ඒවගේම එතුමා එම ව්‍යාපෘතියට අනුමත නොකිරීම පිළිබඳව කණගාටු වෙනවා. අතුකෝරාල මන්ත්‍රීතුමා කීව වගේ අපි කණ්ඩායමක් විදිහට වැඩ කරනවා නම් අපි එම ව්‍යාපෘතිවලට සම්බන්ධ වෙන්න ඕනි. මෙම ව්‍යාපෘතියේ දකින අඩුපාඩු මොනවද, වංචාව මොකක්ද, කොපමණ මුදලක් වංචා කරලා තියනවාද කවුද ඒ වංචාවට මූලික වෙන්නේ, කවුද රාජ්‍ය නිලධාරියා ආදිය ලිඛිතව තර්කානුකූලව ඉදිරිපත් කරන්න කියලා යෝජනාවක් විදිහට මා ඉදිරිපත් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මගේ කොට්ඨාශයේ තියෙන ලෙව්දෙණිය ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන මුදලට කරන්න බැහැ කියලා තාක්ෂණික නිලධාරී මහත්වරු කිව්වා කියලා කියනවා. අවුරුදු හතරකට පෙර මම ලක්ෂ හතරක ප්‍රතිපාදනයක් පරගහකොටුව ළිද සඳහා වෙන් කරලා දුන්නා. ඒ මුදල් ආපසු ගියා. ඒ පිළිබඳවත් ඔබතුමා අවධානය යොමු කරන්න. එම නිසා මෙවර එම ළිද ප්‍රතිසංස්කරණය කිරීම සුදුසුයි. ගරු සභාපතිතුමනි, මේ සභාවේ මෙතෙක් නොවූ සතුටුවෙන කාරණාවක් දැක්කා අරුණ ජයලත් මන්ත්‍රීතුමාගේ යෝජනාවට එතුමාව සම්බන්ධ කර නොගැනීම පිළිබඳව, චමින්ද මාල් මන්ත්‍රීතුමා කණගාටු වෙනවා කියලා හදවතින්ම ප්‍රකාශ කරපු මන්ත්‍රීවරයෙක්.

ඒවගේ මමත් වීථි පහන් විධිමත්ව සවි කිරීම සම්බන්ධව යෝජනාවක් ගෙනාවා ඒක අද වෙලා නැහැ ඔබතුමාගෙන් පිළිතුරක් ලැබුන් නැහැ. කණ්ඩායමක් විදිහට යෝජනාවක් ගෙනාවහම ඒක මෙහෙමෙ භාර ගන්නැත්නම් පියවරෙන් පියවර නීත්‍යානුකූල ක්‍රමවේදයකට භාර ගන්න අදාල තැන්වලට යොමු කරන්න පුළුවන්, ඒත් අපි එතෙන්ට යන්න කැමති නැහැ. ගරු සභාපතිතුමනි, සහෝදරත්වයෙන් අත් දිගු කරලා අපි මේ ගමන යන්න කැමතියි.

ඒවගේම හැමදාම මම කියනවා අබබෝව නන්දෙ මන්ත්‍රිතුමාත් තමන්ගේ ප්‍රදේශයේ මතද්‍රව්‍යවලට එරෙහිව සටන් කරපු හොද පෞර්ෂත්වයක් තියෙන අපි දැකපු හොඳ මන්ත්‍රී වරයෙක්. මේ සභාවේ මෙතෙක් සියලු සභිකයින් සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරලා, මේ සභාවේ වැඩ කරන්න අවස්ථාව දිලා තියෙනවා. ඒකනිසා එක් පාර්ශවයකට ප්‍රතිපාදන දීලා අනෙක් පාර්ශවයට නොදුන්නයි කියලා පළමු වතාවට ඉතිහාසගත වෙන්න එපා. මේ සභාවෙන් කවදාවක් නැති පූර්වාදර්ශ දෙයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, නම්‍යශීලි වෙලා අපේ මේ මන්ත්‍රීවරුන්ටත් අවස්ථාව ලබා දෙන්න. අපි ඔබ තුමාට නිරන්තරයෙන් ශක්තියක් වෙනවා. ඒ නිසා වැරදි කෝණයකින් බලන්න එපා.

ගරු සභාපතිතුමනී, ගරු ප්‍රියන්ත මන්ත්‍රීතුමා , බඹරගල පුරාණ විහාරස්ථාන මාර්ගයේ හාඩ්වෙයාර් ඉදිරිපස බෝක්කුව ඉදි කරා. එම බෝක්කුව ඉදිකරද්දී ප්‍රදේශයේ ජාතික ජන බලවේගයට වැඩිපුරම උදව් කරපු පුද්ගලයෙක් මට පැවසුවා එම බෝක්කුව ඉදි කරන විදිහ සම්බන්ධයෙන් සතුටු නැහැ , ඔබතුමා ඇවිල්ලා මේක බලන්න කියලා. මට අදාල නැති නිසා මම එතනට ගියේ නැහැ. අවශ්‍ය වුවහොත් සහයෝගය දෙමු කියලා මම කීවා. ඊට පසුව එය ඉදි කරගෙන යද්දි , ප්‍රදේශයේ ජනතාව උද්ඝෝෂණයකට ගියා. ඒ පිළිබඳවත් දුරකථනයෙන් කතා කරලා උද්ඝෝෂණයකට යන්න එපා කියලා මම අදාල නිලධාරීන්වත් දැනුවත් කලා.

කෙසේ නමුත් මෙම ව්‍යාපෘතිය අසාර්ථකයි. සභා වාර දෙක තුනකම නිහඬව සිටියේ ප්‍රියන්ත මන්ත්‍රීතුමාගේ හිත හොඳ නැති වෙයි කියලා. තාක්ෂණික නිලධාරීන්ට ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුව හදන්න උපදෙස් ලබා දෙන්නේ අදාල ප්‍රදේශය භාර මන්ත්‍රීවරයා. එමනිසා අදාල ව්‍යාපෘතියෙහි අඩුපාඩු සම්බන්ධයෙන් වගකීමක් මන්ත්‍රීවරයාට තිබෙනවා. මේ බෝක්කුව හදන්න මම නෙවේ කාක්ෂණික මහත්වරු හැදුවේ කියනවා නම් ඒක මම පිළිගන් නැහැ. පාරේ පළල අඩි 24 යි. හදන හැම බෝක්කුවකම ලැල්ලේ පළල අඩි 22 ට දාලා තියෙන්නේ එත් මේකේ ලැල්ල අඩි 18 යි. දාහත් ලක්ෂ තිස්අට දාහයි ඇස්තමේන්තු මුදල විසිඑක් ලක්ෂයක් වෙන් වෙලා තියනවා. එතකොට මේ සල්ලි ඉතිරි කරේ ඇයි? ලැල්ල තව ලොකු කරලා බොක්කු කට ගන්න තියෙද්දී මේ සල්ලි ඉතුරු කරපු එකේ ප්‍රතිඵලය මොකක්ද කාණු කැට දෙකක් දාලා බෝක්කු කටවල් දෙකක් බැන්ද නම් ඊට වැඩිය ලාභයි. බොක්කුව උඩට ගිහින් බලන්න ඇලේ වතුර බහින් නැහැ වෙල්යාය කඩගෙන යන්නේ. වැහි කාලයට තව ඒ ප්‍රශ්නය උග්‍ර වෙයි. ඒ නිසයි කියන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ උපදෙස් ගන්න කියලා. ඔබතුමා හදන බෝක්කුවට මට යන්නත් බලන්නත්, විරෝධතා ගොනු කරන්නත් පුළුවන්. පිළිගන් නැත්නම් පිළිගන්න තැනටත් යවන්න පුළුවන් ඒත් සහෝදරත්වය නිසා එකමුතුකම කඩන්නේ නැතුව යන්නේ. සභාවක ගැටුණොත් හැටදාහක හැටදෙදාහක පමණ ඉන්න මිනිස්සුන්ට අගතියක් වෙනවා. ජනතාවගේ ජන ජීවිතය සුඛිත මුදිත කිරීමේ අරමුණ ඔබට සේම අපිටත් තියනවා. ඔබතුමාට, චමින්ද මාල මන්ත්‍රීතුමා ඇතුළු තව මන්ත්‍රීවරු කිපදෙනෙක්ට තේරෙනවා ඇති නමුත් අනිත් අයට නොතේරෙන්නේ කොතනින්ද කියලා තේරෙන් නැහැ. මෙම සභාවේ එදා ඉඳලා හිටපු මන්ත්‍රීවරුන් ඇතුළු නිලධාරීන් වංචනික ක්‍රියාවක් සිදු කරලා නැහැ කියලා මම අද දෙවනි වතාවටත් කියනවා. එහෙම කළා නම්, ඒ ක්‍රමය කියලා දෙන්න. ඉදිරියේදී ඔබතුමා සහෝදරත්වය ඇතිකර ගෙන සභාව ගෙන යාමේ වගකීම අපේ නායකයා ලෙස පෙරමුණ අරගෙන ඉෂ්ඨ කරයි කියලා බලාපොරොත්තු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි චමින්ද වර්ණසූරිය මන්ත්‍රීතුමා සමඟත් බෝක්කුව අසාර්ථක ව්‍යාපෘතියක් බවට ප්‍රකාශයට පත් කළ කෙනාම , එම පුද්ගලයාම මා හට එම ව්‍යාපෘතිය ඉතා සාර්ථක ව්‍යාපෘතියක් බව. බෝක්කුව අඩි 22 ක් පළල තියෙන්න ඕනි කීවා, බෝක්කුව ඉදි කිරීම සම්බන්ධයෙන් තාක්ෂණික දැනුම මා සතුව නැති නිසා , ඒ සම්බන්ධයෙන් තාක්ෂණික නිලධාරීන්ගේ රාජකාරියට මා බාධා කලේ නැහැ. ප්‍රාදේශීය සභාවක අවුරුදු ගණනාවක් වැඩ කරලා පළපුරුද්දක් තියන නිලධාරීන් ඉන්නේ ඔවුන් ආධුනිකයින් නොවෙයි. බොක්කුවේ කටෙහි ප්‍රමාණය දන්නවා. ඔවුන්ගේ රාජකාරියට මම බාධා කළේ නැහැ. මේ සම්බන්ධව මට ගැටලුවක් නැහැ. අනෙක් කාරණය තමයි අඩි 22 කොන්ක්‍රීට් එක පළල කරන්න කියනකොට චමින්ද මන්ත්‍රීතුමා දන්නවා එතන අනුර හාඩ්වෙයාර් එකේ ගැස් දාලා තියන කඩය අනවසර ඉදි කිරීමක්. ඒක තියෙන්නේ පාරේ. ඒක අයින් කරන්න කියලා සභාවෙන් සහ අපිත් දැනුවත් කළා ඒක අයින් කළේත් නැහැ. පාරේ වතුර ලයින් එක යද්දි බට වලලා තියෙන්නේ පාර මැද්දේ. බටේ පාර මැද්දේ යනකොට ගමේ කිසිම කෙනෙක් නිදාගෙන හිටියේ නැහැ. එහෙනම් මේ බටේ කාණුවට එහායින් යන්න ඕනි කියලා කියන්න ඕන. අනික තමා කැටගල් අල්ලලා තියනවා හාඩ්වෙයාර් එක ළඟ, තනිකරම පාරට බර කරලා අල්ලලා තියෙන්නේ. කාණු පද්ධතියේ තියෙන්නේ පොඩි බෝක්කුවක්, ඔබතුමා දන්නවා ඇති එතන ජල සම්පාදන මණ්ඩලයෙන් කාණුවේ පෙට්ටියක් හයි කරලා තියනවා එතකොට මහමෙව්නාවේ පාරට වතුර එන්නේ. ඒකටත් උඩින් එන වතුර පාර ඒ පෙට්ටියේ ගැටිලා ඒ වතුර පාරට එනවා.

අනිත් කාරණය, මම කොන්ත්‍රාත්කරුවා පිළිබඳව පෞද්ගලිකව දැන හැඳුනුම්කමක් නැහැ. එතන ප්‍රශ්න ගොඩාක් තියනවා. ගමේ මනුස්සයාට කොන්ත්‍රාත් එක දුන් නැහැ කියනවා තවත් සමහරු අත්සන් කරපු සමිතියට දුන් නැහැ කියනවා. මම කොන්ත්‍රාත් එක දෙන්න සම්බන්ධ වුණේ නැහැ. මට කොන්ත්‍රාත්කරුවන් සහ ඔවුන්ගේ වැඩ සම්බන්ධව අවබෝධයක් නැහැ. ගොවි සමිතියෙන් ඉල්ලුවා ඒකට දුන් නැහැ කියලා මුහුණු පොතෙත් මඩ ප්‍රහාර යනවා.

ඔවුන්ගෙන් ඇහුවාහම කීවේ ඒක කරන්න පුළුවන් තරම් මුදල් ප්‍රමාණයක් නැහැ කියලා. මඩ ප්‍රහාර ගහන්න හිතාමතාම මේක අවියක් කරගෙන තියනවා. හැබැයි මේක ප්‍රමාද වීමක් තියනවා. මෙහි තිබ්බේ වැලි සහිත පසක් පාර කඩනකොට අනිත් පැත්ත කඩා වැටෙනවා තාක්ෂණික උපදෙස් අනුව ක්‍රමනාකූලව පාර කඩලා ඉවත් කළේ, ඒ එක්කම පොසොන් පෝය නිසා කඩන්න එපා කීවා, වර්ෂාව, පන්සලේ වැඩසටහනක්, ඊටපස්සේ 10 වෙනිදා ශීඝ්‍රත්වය ආදී කාරණා නිසා ප්‍රමාද වීමක් සිද්ධ වුණා. මන් හිතන්නේ ආයේ උසස් පෙළටත් පාර කඩන්න එපා කියලා මිනිස්සු ඉල්ලීම් කරයි. ඔවුන් තම අවශ්‍යතාවය අනුව තමයි හැසිරෙන්නේ.අනිත් එක තමා හාඩ්වෙයාර් ප්‍රශ්නය ඒගොල්ලෝ ලොකු උත්සාහයක යෙදුණා ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුව, සැලැස්ම වෙනස් කරගන්න ඒත් ඒකට අවස්ථාව දුන්නැහැ. ඉතින් මට අවශ්‍යතාවය තිබ්බේ ගමට හොඳ වැඩක් කරන්න.

මේ සම්බන්ධයෙන් ගමේ අය කැඳවලා හාමුදුරුවෝ ඉන්න තැනම මේ ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුව, සැලැස්ම ෆොටෝ කොපි දීලා කීවා මේකේ මොනවා හරි අඩුපාඩු තියනවා නම් මට කියන්න කියලා. හැබැයි මෙතුමා කියන විදිහට ගමේ කිසිම කෙනෙක් විරුද්ධව කතා ළේ නැහැ. ගමේ මිනිස්සු, ඔබ තුමාට සද්භාවයෙන් කතා කරලා අඩුපාඩු කීවා නම් මටත් මේක මෙහෙම වෙනස් වෙන්න ඕනි ප්‍රශ්නයක් තියනවා කියලා කියන්න තිබුණා. කිසිකෙනෙක් අද වෙනකල් කතා කරලා නැහැ. ගරු සභාපතිතුමනි, යම් දේශපාලනික හෝ පෞද්ගලික අවශ්‍යතාවයකට ගමේ කණ්ඩායමක් ඉන්නවා ගම දියුණු වෙනවානම් සංවර්ධනය වෙනවා නම් ඒක කඩාකප්පල් කරන්න. එත් අපි මේක කරන්නේ සද්භාවයෙන්. මම දන්න කියන සමාජයේ පිළිගත් පුද්ගලයෙක් මට කතා කරලා කියනවා ප්‍රියන්ත මන්ත්‍රීතුමා සැහෙන කාලයක් තිස්සේ බලාපොරොත්තු වුණ දෙයක් මේ වැඩේ හොඳයි හැබැයි මේකට කකුලෙන් අදින සමහර මිනිස්සු ඉන්නවා කියලා. මේ ව්‍යාපෘතියෙන් එක් කෙනෙක් දෙන්නෙක් අඩුපාඩු ජේන්නුවට සියයට අනූවක්ම ව්‍යාපෘතියට කැමතියි. මේක නිසා ගමේ මිනිස්සු පුදුම දුකක් වින්දා වැසි කාලවලට පාසල් ළමුන් අපහසුතාවයන්ට පත්වෙනවා. මෙවරත් සභාවෙන් වෙන් වුණේ ලක්ෂ හයයි පළාත් පාලනෙන් තමා ඉතිරි ලක්ෂ පහලොවක් ආවේ. ලක්ෂ විසි එකක් කීවට ඇස්තමේන්තුව සකස් කළේ දාහත් ලක්ෂ තිස් පහකටයි. කටයි. බොක්කුවට සම්පූර්ණයෙන්ම ලක්ෂ පහලොවක් යනවා ඉන්ටලොක් අල්ලන්න ලක්ෂ 2.35 ක් යනවා ඉතුරු ප්‍රතිපාදන වර්ෂ අවසානයේ වෙනත් ව්‍යාපෘතියකට බැර වෙනවා. නිවැරදිව මේ ඉදි කිරීම සිදු කරන්න මෙච්චර මුදලක් වැය වෙනවා කියලා තක්සේරු කරනවා. ඉතින් මට එතනින් එහාට කියන්න බැහැ ලක්ෂ විසි එකම මේක ව්‍යාපෘතියට දාලා සංවර්ධනය කරන්න කියලා. මේ ඇස්තමේන්තු සම්බන්ධව අවබෝධයක් නැති නිසා ප්‍රදේශයේ ඉන්න ඉංජිනේරු නිලධාරිනියකටත් පෙන්නලා නිවැරදි බව තහවුරු කර ගත්තා. මම කියන්නේ යම්කිසි සංවර්ධනයක් වෙනවා නම් විපක්ෂ මන්ත්‍රීතුමන්ලා හැටියට ඔබතුමාලට ඒකට සහභාගි වෙන්නත්, බලන්නත්, අඩුපාඩු පෙන්නලා දෙන්නත් පුළුවන්. හැබැයි පක්ෂ විපක්ෂ හැටියට නෙවේ අඩුපාඩු තියනවා නම් කෙලින්ම අපිට කියන්න. නමුත් මිනිස්සු මෙහෙම උද්ඝෝෂණය කරන්න හදනවා කියලවත් ඔබතුමාවත් මට කීවේ නැහැ. අදටත් කඩේ ළඟට ගියොත් අනුර කියන්නේ මන්ත්‍රීතුමා වැඩේ හොඳයි කියලා. කොට්ඨාසයේ මන්ත්‍රීවරයාට හෝ නිලධාරීන්ට ව්‍යාපාතියක් කළත් සද්භාවයෙන් අඩුපාඩු පෙන්නලා දෙන්න කියලා ඉල්ලා සිටින අතර, වඩුවාව ඒ පාලම ඉදි කිරීම අසාර්ථකයි නම් සාක්ෂි සහිතව ඔප්පු කරලා මේ ව්‍යාපෘතිය නතර කර ගෙවීම් නතර කරන්න කියලා ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, සියලු කාරණා යටතේ දැක්ක දෙයක් තිබුණා. බෝක්කුව සංවර්ධනය කිරීම සඳහා ප්‍රියන්ත මන්ත්‍රීතුමා ගමේ අයත් එක්ක කතා කළා නම්, ප්‍රාදේශීය සභා මාර්ගයේ නම් කඩය හදාගෙන තියෙන්නේ ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයා හැටියට, සභාපතිතුමාගේ නියෝජිතයා වශයෙන් දැන ගන්න ඕනි කාර්මික නිලධාරී මහත්වරු ගිහින් සිදු කරන දැනුවත් කිරීම අනුව, එය කඩලා ඉවත් කරලා වැඩේ කරන්න ඉඩ දෙන්න. මෙවැනි ඉදි කිරීම් ගණණාවක් මේ ප්‍රදේශයේ තියනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙවැනි අවස්ථාවලදී දැඩි තීන්දුවක් ගන්න. මෙතනදී සංවර්ධනයක් වෙලා තියනවා ගැටලුවක් මතුවෙලා තියනවා මන්ත්‍රීවරු අපහාසයට උපහාසයට ලක්වෙලා තියනවා. ඒත් ව්‍යාපාරිකයෙක් පැත්තක ඉඳලා සියල්ල උත්සන්න කරලා තියනවා. ඒ නිසා මේ සභාවේ ගෞරවයට අභිමානයට හානියක් වෙන්න ඉඩ තියන්න එපා කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මඩවල ප්‍රදේශයේ ගැටලුවක් තියනවා. මම උදේ සභාවට එනකොට දුරකථ ඇමතුමක් ආවා. ප්‍රදේශයේ වතුර ලයින් එක කපනවා කියලා සතියක් තිස්සේ වෙනවා කියලා. කොන්ක්‍රීට් කරන තැනටත් ලොකු ගැටලුවක් ඇවිල්ලා තියනවා. මම එතෙන්ට ගියා. සංවර්ධන කටයුත්තක් කරන අවස්ථාවේදී සති ගණන් දිගට ඇදෙන් නැතුව කඩිනමින් සිදු කළ යුතුයි කියන ප්‍රකාශය මම කරනවා. අරුණ මන්ත්‍රීතුමා, අතුකෝරාල මන්ත්‍රීතුමා පිළිබඳ සඳහන් කරනවා නම් එදා ඉඳලා ජනතාවත් එක්ක කටයුතු කරපු මිනිස්සුන්ගේ හිත් දිනාගත් මන්ත්‍රීවරු දෙදෙනෙක්. කුමන පක්ෂයකින් ඡන්දය ඉල්ලුවත් ජනතාව තමන්ගේ ඡන්දය දෙනවා. මොන රැල්ලක් ආවත් ඒ අය පරාජය කරන්න බැහැ. ඒ අයට අඩුපාඩුවක් කරනවා නම් අපිත් විරුද්ධයි. අපි සහයෝගයෙන් කටයුතු කරන්න ඕනි. අපි ඇවිත් ඉන්නේ ජනතාවට සේවය කරන්න මෙතන ඇවිත් ගැටුනොත් අවසානයට මේක ජනතාවගේ ප්‍රශ්නයක් බවට පත් වෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් සලකා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒවගේම ප්‍රාදේශීය සභා පාරක මධ්‍ය රේඛාවේ සිට ඉදිකිරීමක් සිදු කළ යුතු දුර ප්‍රමාණයෙන් බැහැරව ඉදි කිරීමක් සිදුවෙලා තියනවා නම් ඒක නවත්තන්න පූර්ණ බලතල ප්‍රාදේශීය සභාවට තියනවා.

ඒ නිසා ඒවා පිළිබඳවත් ක්‍රියාත්මක වෙන්න. අලුත් සංස්කෘතියක් සමඟ දේශපාලනය බිහිවෙලා තියනවා. හොඳ සංවර්ධන කටයුතු සිදුවෙමින් මේ රට ඉදිරියට දියුණු වෙනවානම් අපිත් කැමතියි, අපිත් ඒකට සහයෝගය ලබා දෙනවා කියමින් නිහඬ වෙනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා,තුමියන්ලා, නාරද මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නය පිළිබඳව මට දුරකථන ඇමතුම් ගණනාවක් ආවා. පාර හරහා කපලා ඒක වහගන්න විදිහක් නැහැ සභාවෙන් මෝටර්ග්‍රේඩර් ඉල්ලනවා. මම ඒක අධීක්ෂණය කරන්න ගියා කිලෝමීටර් එකයි ගාණක වතුර යන ව්‍යාපෘතියක්. ඇත්තටම පාර හත් තැනකින් විතර කඩලා. එතන ව්‍යාපෘතියට සම්බන්ධ වෙලා ඉන්න සහෝදරයා කීවා පාර හත් තැනකින් කඩලා තියෙන්නේ අපි කොන්ක්‍රීට් දාලා දෙනවා ඔබතුමාලගේ මොටර් ග්‍රේඩර් ඉල්ලුවේ නැහැ කියලා. අපි කුලියට බැකෝ එකක් ගෙනල්ලා තියනවා ඒකෙන් වලවල් වහගෙන යන ගමන් ඉන්නේ කියලා. මට දුරකථන ඇමතුම් දුන්න කිසිම පුද්ගලයෙක් එතන නැහැ. හොඳ සංවර්ධන කටයුත්තක් යනවා ඉතින් බලාගෙන ඉන්න බැරි අය විවිධ කතා හදනවා. ඒක තේරුම් ගන්න ඕනි. මම අවධානයෙන් ඉන්නේ අදාල තැනටම ගිහින් තොරතුරු අරගෙන ලේකම්තුමියගෙන් විමසලා උපදෙස් පතනවා. එහෙම නැතුව අනවබෝධයකින් මම මෙතන කටයුතු කරන් නැහැ. අතුකෝරාල මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා මට දෙන යෝජනා භාර ගන්නැහැ කියලා. අන්තිම අවස්ථාවේදී ඔබතුමා ඇවිත් යෝජනා දුන්නහම මම ඒ පිළිබඳව දන්නැහැ. අපිට සදාචාරයක් තියෙන්න ඕනි ඇවිත් කතා කරන්න. යෝජනා දවස් හතකට පෙර ලබා දෙන්න කියලා හැමදාම අපි කියනවා. දවස් හතම මට ඕනි නැහැ ඔබතුමා කලින් දවසේ ඇවිත් මේ යෝජනාව පිළිබඳව මාත් සමඟ කතා කරානම් හොඳයිනේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අනිත් යෝජනා දාලා තියනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, මම ඒකට පිළිතුරු දෙන්නම්. කමිටුවලදී, මෙතනදී මට යෝජනා දෙනවා. ඍජුවම මාත් සමඟ කතා කළා නම් මම පිලිතුරු දෙනවා. ඔබතුමා වෙනස් කරන්න ඉදිරිපත් කරන යෝජනාවයි ප්‍රියන්ත මන්ත්‍රීතුමාගේ යෝජනාවයි දෙකක්. කාක්ෂණික නිලධාරීන් මහත්වරුගේ අධික්ෂණයෙන් එම වයෘපෘතිය ලක්ෂ දෙකකින් සිදු කරන්න බැහැ කියලා කියනවා, ඒනිසා ඒක වෙනස් කරන්න ඕනි. නමුත් ඔබතුමාගේ මැදිකැලේ වත්ත යෝජනාවට ලක්ෂ පහක් වෙන්වෙලා තියනවා. ඒකේ තාක්ෂණික දෝෂ නැහැ. ඒ යෝජනාව ක්‍රියාත්මක කළ හැකියි. ඔබතුමා හිතලා ඒ යෝජනාව වෙනස් කරනවා, ඒත් යම් විධිමත් ක්‍රමවේදයකට යා යුතුයි. මුලින් අදාල යෝජනාව සම්මත කරගෙන පසුව තාක්ෂණික තීරණයන්ට අනුව යෝජනාව වෙනස් කළ යුතු වෙනවා. සභාවේ මන්ත්‍රීවරු 25 දෙනාටම සමානව මේ සභාවෙන් යමක් කරන්න අවශ්‍යයි කියන ස්ථාවරයෙහි මම ඉන්නවා. රේඛීය අමාත්‍යාංශය හරහා එන වැඩසටහන් ගොඩාක් තියනවා. ඒවා ඒ ඒ ප්‍රදේශයේ ඉන්න මන්ත්‍රීවරුන් කරනවා. සභාවේ මන්ත්‍රී කියලා මේ සියල්ලටම මෙහෙම කරන්න කියලා අපිට කියන්න බැහැ. අපි 2018 ඉදලා මේ සභාවේ හිටියා විපක්ෂ මන්ත්‍රීවරුන්ට මොනවත් දුන් නෑ. ලක්ෂ පහක් තියා ලක්ෂ තුනක්වත් දුන් නෑ. ඒත් අපිට සදාචාරයක් තිබුණා. අලව්ව බලප්‍රෙද්ශය ගත්තහම, මොහාන් මන්ත්‍රීතුමා යටතේ වැඩසටහන් විසි ගාණක් විතර තිබ්බා අපි කවදාවත් එතුමාගේ වැඩසටහන්වලට ඇඟිලි ගැහුවේ නැහැ. ඒ නිසා තීන්දු තීරණ සමඟ ආණ්ඩුවේ වැඩපිළිවෙල ගමට ගෙනියන්න ආණ්ඩුවේ මන්ත්‍රීවරයාට අපි අවස්ථාව දුන්නා. කවදාවත් අපි කිසිම තැනක කිසිම දේකට මැදිහත් වෙලා නැහැ. හිටපු සන්ධ්‍යාකුමාර සභාපතිවරයාගේ අත්තනෝමතික ක්‍රියා කලාපය පරාජය කරා. ඉන් අනතුරුව තමයි විපක්ෂය මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන දෙන්න තීරණ කළේ. ඒ අත්දැකීම් තියන නිසයි දැඩි අරගලයක් කරන්නේ 25 දෙනාටම සභාවෙන් දෙන දේ දෙන්න. ඒ ස්ථාවරයේ මම ඉන්නවා. විධිමත් ක්‍රමයකින් තොරව යෝජනා මෙලෙස ක්‍රියාත්මක කරන්න ප්‍රකාශ කරනව නම් මම මේ සභාවේ පුටුවෙහි සභාපති ලෙස කටයුතු කරන්න අවශ්‍ය නැහැ. මම නිලධාරීන් ගැනත් ප්‍රදේශය ගැනත් දන්නවා. අදාල තැනදී අදාල විදිහට හැසිරෙන්න මම දන්නවා. ඔබතුමාලත් එක්ක වැඩ කරනවා, වීජී පහන් දාන්න ඕනි නම් ඒකටත් උදව්කරනවා. නමුත් ඒක ඔබේ අයිතිවාසිකමක් විදිහට සලකමින් නුසුදුසු ඉල්ලීම් මගෙන් කරන්න එපා. අපි ජාතික ජන බලවේගය ආණ්ඩුව නියෝජනය කරන පාර්ශවයන් අපෙත් වැඩ තියනවානේ ඒකත් බේරගෙන ඔබටත් ඇහුම්කන් දෙන්න ඕනි කවුරුත් වැරදියට තේරුම් ගන්න එපා. අපි එකඟතාවයකට එමු. ඔබ සියලු දෙනා න්‍යාය පත්‍රය යොමු කරන්න දවස් හතකට කලින් යෝජනා ගෙනත් දෙන්න. පක්ෂ විපක්ෂ බේදයක් මට නැහැ.

අනික නිලධාරීන් හරහා ඉල්ලීම් ගෙනල්ලා කුමක් හෝ ප්‍රතිපාදනයක් ජනතාවට දෙන්න කියනවා නම් ඔහුගේ දේශපාලනය මම බලන් නැහැ මට අදාලත් නැහැ. මම එක උදාහරණයක් කියන්නම්. නුංගමුවේ කාන්තාවක් ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කරලා තියනවා. "මම බිම්මල් වගාවක් කරන කෙනෙක් ඒ සඳහා මා හට විල්බැරෝවක් සහ සීලර් එකක් ලබා දෙන්න" කියලා . මෙම ඉල්ලීම් ලිපියෙහි පිටු 4ක් තිබුණා. බිම්මල් වගාව සම්බන්ධයෙන් සිදුකළ ව්‍යාපෘතියට අදාල සහතිකය, ඒක ලියාපදිංචි කරපු සහතිකය, ඊට අදාලව පොත් ටික ලස්සනට පෙළගස්සලා ඒකත් සමඟ එම කාන්තාවගේ පින්තූරයකුත් දාලා තිබ්බා. මෙම කාන්තාව කවුද යන වග සොයා බලන ලෙස නුංගමුව කොට්ඨාසය නියෝජනය කරන අකිල සහෝදරයාව දැනුවත් කළා. විදේශ ගත වෙලා ලංකාවට පැමිණි මගේ මිතුරෙකුගේ උපකාරයෙන් ඒ කාන්තාවට මෙම උපකරණ දෙක පරිත්‍යාග කළා. ඒ සම්බන්ධව මේ සභාවේ ඉන්න ලේකම්තුමිය ඇතුළු කිසිම නිලධාරියෙක් දැනුවත් නැහැ. ඒවගේම තුන්දවසක් ඇවිත් වරිපනම් ගෙවන්න බැහැ කියලා වයසක පුද්ගලයෝ ඇවිත් කීවා. මම ඒ අයට රු. 3000.00 ක් දීලා කීවා ඉතිරි ටික ගෙවාගෙන යන්න කියලා. ඉතින් වැඩ කරනවානම් එහෙමයි. මම අජිත් පරණගමගේ. අපි ඉදිරියට සාමූහිකව වැඩ ටික කරගෙන යමු කියලා ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ප්‍රජා සංවර්ධන යෝජනා යටතේ ලෙව්දෙණිය ග්‍රාම නිලධාරී වසමට අයත් හඟවත්ත ග්‍රාමයේ දෙණියේ ළිඳ සංවර්ධනයට රු. 200000/- ක මුදලක් වෙන් කර ඇති අතර,එම ප්‍රතිපාදන මුදල පොරමඩල ග්‍රාම නිලධාරී වසමේ පරගහකොටුව පොදු ළිඳ ගම්වැසියන්ගේ ශ්‍රම දායකත්වය මඟින් සංවර්ධන කටයුතු සිදු කර ගැනීම සඳහා සංශෝධනය කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>(05-24) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව - අංක 07/04/05/24 දරණ යෝජනාව</u>**
**<u>2025 වර්ෂයේ සංවර්ධන යෝජනා සංශෝධනය කිරීම.</u>**

2025 අලව්ව ප්‍රාදේශීය සභා අයවැය යෝජනා යටතේ වඩුවාව කොට්ඨාශයේ ලෙව්දෙණිය ග්‍රාම නිලධාරී වසමට අයත් ලෙව්දෙණිය මාවත්ත මාර්ග සංවර්ධනය යනුවෙන් එකී මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීම සඳහා රු.1000000/- ප්‍රතිපාදන මුදලක් වෙන් කර ඇත. මෙම පැති බැම්ම ඉදි කිරීම පිළිබඳ ප්‍රාදේශීය සභාවේ තාක්ෂණික නිලධාන් විසින් පරීක්ෂාවට ලක්කර ඇති අතර , එම මුදලින් අදාල පැති බැම්ම ඉදි කිරීමට නොහැකි බව පෙන්වා දී ඇත. ඒ අනුව එම ප්‍රතිපාදන මුදල ලෙව්දෙණිය ග්‍රාම නිලධාරී වසමේම පහත මාර්ග කොන්ක්‍රීට් දමා සංවර්ධන කිරීම සුදුසු බව ගම්වාසීන්ගේ ඉල්ලීම වේ.

(අ) ලෙව්දෙණිය මාවත්ත මාර්ගයේ අවශ්‍ය ස්ථාන කොන්ක්‍රීට් කිරීම සඳහා රු. 500,000.00 ක මුදලක් වෙන් කිරීම.

(ආ) බඹරගල සිට හඟවත්ත දක්වා දිවෙන මාර්ගයේ පිංකොටුව කොටසේ හඟවත්ත ප්‍රජා ශාලාව අසල ඉතිරිව ඇති කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා රු. 500,000.00 ක මුදලක් වෙන් කිරීම.

ඒ අනුව ඉහත සඳහන් ව්‍යාපෘතිය සංශෝධන කරදෙන ලෙස යෝජනා කරන අතර , ඊට අදාල සංවර්ධන කටයුතු කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2025 අලව්ව ප්‍රාදේශීය සභා අයවැය යෝජනා යටතේ වඩුවාව කොට්ඨාශයේ ලෙව්දෙණිය ග්‍රාම නිලධාරී වසමට අයත් ලෙව්දෙණිය මාවත්ත මාර්ග සංවර්ධනය යනුවෙන් එකී මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීම සඳහා රු.1000000/- ප්‍රතිපාදන මුදලක් වෙන් කර ඇති අතර, එම ප්‍රතිපාදන මුදල ලෙව්දෙණිය ග්‍රාම නිලධාරී වසමේ ලෙව්දෙණිය මාවත්ත මාර්ගයේ අවශ්‍ය ස්ථාන සහ බඹරගල සිට හඟවත්ත දක්වා දිවෙන මාර්ගයේ පිංකොටුව කොටසේ හඟවත්ත ප්‍රජා ශාලාව අසල ඉතිරිව ඇති කොටස රු. 500,000.00 බැගින් වෙන් කර කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම සඳහා සංශෝධනය කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-25) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/04/05/25 යෝජනාව**
**රථ ගාල් ගාස්තු අය කිරීම සම්බන්ධවයි.**

අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් හුම්බුළුව සමිති ශාලාව පිහිටි ඉඩමේ (හුම්බුළුව සී/ස රිට්ස් ක්ලෝතින් පුද්.සමාගම ආසන්නයේ) ඉදිරිපස බස් රථ ගාල් කරන බව ආදායම් පරීක්ෂක මහතා දන්වා ඇත. එම ඉඩමෙහි ගාල් කරන බස් රථයක් සඳහා දිනකට රු. 100/- බැගින් ඔවුන් ගාල් කරන දින ගණන අනුව මාසික ගාස්තුවක් අය කිරීම සුදුසු බව කැප්පිටිවලාන උප කාර්යාලයේ ආදායම් පරීක්ෂක මහතා දන්වා ඇත. ඒ අනුව බස් රථ ගාල් කිරීම සඳහා දිනකට රු. 50/- බැගින් රථයකට අය කිරීම සම්බන්ධයෙන් ගැසට් කර ඇති බවත් , ගාල් කරන දිනයක් සඳහා රු. 50/- අය කිරීම සුදුසු බවට ආදායම් ප්‍රවර්ධන නිලධාරී විසින් වාර්තා කර ඇත. ඒ අනුව ඉහත සඳහන් ස්ථානය සඳහා ගැසට් පත්‍රයට අනුකූලව බස් රථයකට දිනකට රු. 50/- බැගින් අය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.
මෙම ඉඩම හුම්බුළුව කොට්ඨාසයේ පිහිටා තියෙන්නේ. මේ වෙනකොට සභාවට එන ආදායම ගැටලුවක් වෙලා තියන නිසා අපේ සභාවට අයිති මෙවැනි ආදායම් උපයන ඉඩම් පිළිබඳව කමිටුවක් හරහා සාකච්ඡාවට යොමුකරලා තීරණයකට යමු. මේ පිළිබඳව තාක්ෂණික නිලධාරී මහතාත් දන්නවා ගාමන්ට් එකේ බස් තමා මෙතන නවත්තන්නේ. මේකෙන් අපේ සභාවට ආදායමක් ලබා ගන්න පුළුවන්. වැසි කාලවලට තමා ගැටළුවක් මතුවෙන්නේ. ඉදිරියේදී අපි ඒකටත් යෝජනාවක් ගේනවා. ඒ නිසා රු.50.00 ක මුදලක් බස් එකකින් අය කරගැනීමටත්, ඒ සම්බන්ධයෙන් ගාමන්ට් ෆැක්ට්‍රි එක දැනුවත් කිරීමත් සුදුසුයි කියලා මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව හොඳයි. එතන ජනතාව පොදු කටයුතු සිදු කරන ස්ථානයක්. පොදු කටයුත්තක් සිදු කරන අවස්ථාවන්වල වාහන බාධාවක් නොවන පරිදි ඒ කටයුත්ත සිදු කරන්න කියලා මේ සම්බන්ධයෙන් කොන්දේසියක් දැම්මොත් හොඳයි කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අද වඩාත්ම සතුටු වෙන්න ඕනි දවසක්. 2015 උද්ධාල මන්ත්‍රීතුමාගේ සහෝදරයා ඇතුළු ඒ ප්‍රදේශයේ ඉන්න තරුණ කණ්ඩායම පොදු කටයුතු සඳහා යූ.බී.විජේකෝන් මහතා ලබා දීපු ඉඩම්වල ඉතුරු කොටසේ කැල්ලක් අස්ථානගත වෙලා තියෙන්නේ මෙම ඉඩමෙහි ඉතුරු කොටස පොදු කටයුතු සිදු කිරීම සඳහා බේරලා දෙන්න කියලා ඉල්ලීම් කළා. ඒ අවස්ථාවේ 2015 ලක්ෂ 10 වැඩසටහන එක්ක ප්‍රාදේශීය ලේකම් වැලිගල්ල මහතා සමඟ කතා කළාම, මේ ඉඩමෙහි ප්‍රාදේශීය සභාවට මේක හදන්න බැහැ. ඒකේ වෙනම පදනමක් තියෙන්නේ කියලා එතුමා ප්‍රකාශ කළා. නමුත් දිවන්ගත හිටපු ගාමිණී ගුණදාස මහතාගේ කාලයේ ඒ ප්‍රදේශයේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල හිතවතෙක් මෙම ඉඩමට පස් දාලා වල ගොඩ කළා. එවෙලෙහි ගාමිණී ගුණදාස මහතා ඒ පිළිබඳව අපි නිශ්ශබ්දව ඉමු කීවා. ඉඩම ගොඩ කරලා වහලෙකුත් ගැහුවට පස්සේ අපේ සභාවේ සෞඛ්‍ය කම්කරු මහත්වරු යවලා වහලෙත් එක්ක ගලවගෙන ආවා. ඒ පිළිබඳව ඉඩම් කොමසාරිස් ජනරාල් තුමාත් සමඟ කතා කරා. මේක LRC ඉඩමක් නිසා මේකට ගාමිණී ගුණදාස මහතා රු. 25000.00ක් සභා මුදලින් ගෙව්වා. මේ සම්බන්ධව තිබූ ලිපිගොනුව අස්ථානගතයි. නමුත් ඒ කාලයේ මේකේ කොපියක් මා සතුව තිබුණා. කවදා හරි දවසක මේ බල ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය වන අවසාන භූමි භාගය කියලා දැනගෙන හිටියා. ප්‍රාදේශීය ලේකම් සමඟ කතා කරලා ඒක අරගත්තා. සමූපකාරයෙන් ලක්ෂ 10 ගිවිසුම අත්සන් කරලා ප්‍රදේශයේ කණ්ඩායමත් සමඟ එකතුවෙලා ගොඩනැගිල්ල ඉදි කරන්න කටයුතු කළා. ප්‍රදේශයේ ඉල්ලීමක් තිබුණා කුඩා දරුවන්ට සෙල්ලම් කරන්න හැකි වන අයුරින් වටේට දැල් වැටක් ගහලා එතන සුදුසු පසුබිමක් සකස් කරලා දෙන්න කියලා. ඉදිරියේදී ඔබතුමා ඒ සම්බන්ධව කටයුතු කරයි කියලා බලාපොරොත්තු වෙනවා. ගරු උපසභාපතිතුමිය මේ සම්බන්ධයෙන් යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව සතුටු වෙනවා. සභාවක් විදිහට ගත්තු තීරණයක ප්‍රතිඵලයක් අද දකිනවා ඒ පිළිබඳව නැවතත් සතුට ප්‍රකාශ කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් හුම්බුළුව සමිති ශාලාව පිහිටි ඉඩමේ (හුම්බුළුව සී/ස රිට්ස් ක්ලෝතින් පුද්.සමාගම ආසන්නයේ) ඉදිරිපස බස් රථ ගාල් කරන ස්ථානය සඳහා ගැසට් පත්‍රයට අනුකූලව බස් රථයක් ගාල් කිරීමට දිනකට රු. 50/- බැගින් ගාස්තුවක් අය කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-26) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/04/05/26 දරණ යෝජනාව**
**පුරප්පාඩු තනතුරු සඳහා ආදේශක සෞඛ්‍ය කම්කරුවන් බඳවා ගැනිමට අනුමැතිය ලබා ගැනිම.**

අලව්ව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ප්‍රධාන නගරය සහ උප නගර 2 ක කසළ එකතු කිරිමේ කාර්යයන්වල සේවකයින් 6 දෙනෙකු යෙදී සිටින අතර 2024 වර්ෂයේ සේවකයින් දෙදෙනෙකු විශ්‍රාම යන ලදි. එමෙන්ම 2025 වර්ෂයේ ජනවාරි සිට නව මාර්ගයන් වල කසළ එකතු කිරිම ආරම්භ කිරීමත්, වරිපනම් සීමාවෙන් පිටත කසළ එකතු කිරිමත් සමඟ දෛනික කසළ ටොන් 07 ක පමණ ප්‍රමාණයක් එකතු කරනු ලබයි.

තවද නව සතිපොල භූමියේ විශාල කසළ ප්‍රමාණයක් එකතු විමත්, වීදි ඇමදීම, කාණු පිරිසිදු කිරීම, තණකොල කැපීම ආදි කාර්යයන් සිදු කිරිම සඳහා දැනට සිටින සෞඛ්‍ය කම්කරුවන් ප්‍රමාණවත් නොවේ. දෛනික ගෙවීමේ පදනම මත සෞඛ්‍ය කම්කරුවන් තිදෙනෙකු ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියෙන් බඳවා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.
සඳුදා දිනක, මම ඉතා සංවේදී දර්ශනයක් දැක්කා. දැඩි වර්ෂාපතනයක් වෙලාවේ සෞඛ්‍ය කම්කරු මහත්වරුන් දෙදෙනෙක් බැරල් එකකට කසල එකතු කරනවා. ඒක ලිස්සලා යනවා. ඔවුන් දැඩි අපහසුතාවයකින් ඒ කටයුත්ත සිදු කළේ. ඒ අවස්ථාවේ වෙන සෞඛ්‍ය කම්කරු මහතෙකුගෙන් ඇහුවා රේන්කෝට් නැද්ද කියලා. රේන්කෝට් දෙනවා ඒත් ඒවා ඉරෙනවා ඒක ඊට වඩා අපහසුයි කියලා සඳහන් කළා. කම්කරුවෝ බඳවා ගන්න ඕනි ඒ වගේම අපේ සභාවෙන් වැඩි වැටුපක් ලබන්න ඕනි පිරිසක්. ඔවුන් මේ නගරය පිරිසිදු කරමින් විශාල රාජකාරියක් සිදු කරන පිරිසක්. මේ යෝජනාවත් සමඟම මෙම කම්කරුවන් සඳහා ගුණාත්මක තත්වයෙන් උසස් රේන්කෝට් එකක් ලබා දීම සුදුසුයි කියලා ප්‍රකාශ කර සිටිනවා.

ඒ අනුව දෛනික ගෙවීම් පදනමට සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරුවන් තිදෙනෙකු ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියෙන් බඳවා ගැනිම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**යථා පරිදි කල් දී නොමැති යෝජනා**

**(05-27) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/04/05/27 දරණ යෝජනාව**
**පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන - 2025**

**බෝයවලාන මහජන පුස්තකාලය ප්‍රතිසංස්කරණය කිරිම.**

අලව්ව සභාව විසින් ඇස්තමේන්තු සකස්කර ඉදිරිපත් කර ඇති උක්ත වැඩ විෂය සඳහා අංක NWP/CM/PL/01/06/2025 හා 2025.07.31 දින ලිපියෙන් වයඹ පළාත් ප්‍රධාන අමත්‍යාංශය මගින් ඇස්තමේන්තුව අනුමත කර ඇති අතර පළාත් පාලන කොමසාරිස් වෙත ප්‍රතිපාදන නිදහස් කිරීම සඳහා ලිපිය යොමුකර ඇත. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නම්කර එවා ඇති බෝයවලාන ගොවි සංවිධානය මගින් ගිවිසුම් ගතවී වැඩ ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නම්කර එවා ඇති බෝයවලාන ගොවි සංවිධානය මගින් ගිවිසුම් ගතවී බෝයවලාන මහජන පුස්තකාලය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-28) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවෙන් කරනු ලබන යෝජනාව - අංක 07/04/05/28 දරණ යෝජනාව**
**මඩවල මද්දුම බණ්ඩාර පෙර පාසලේ පෙර පාසල් සහායිකාවක ලෙස සේවය කරන පී.ලක්ෂිකා මදුවන්ති විජේතුංග මියගේ දෛනික දීමනාව ලබා ගැනීම**

2025.07.23 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා තීරණ අංක 08 ට අනුව, 2021.11.16 දින සිට මැදගම්පොල මල්ගමු පෙර පාසලේද, 2023-09-21 දිනැති ව/පපාදෙ/01/04/01/01-2023 හා පෙර පාසල් සහායිකාවන් ලබා ගැනීම සම්බන්ධ ලිපියට අනුව 2024-03-25 දින සිට මේ දක්වා පෙර පාසල් සහායිකාවක ලෙස මඩවල මද්දුම බණ්ඩාර පෙර පාසලේ සේවය කරන පී.ලක්ෂිකා මදුවන්ති විජේතුංග මිය දැනට පෙර පාසල් අරමුදලින් රු 7500/- දීමනාවක් ලබමින් සේවය කරනු ලබයි.

මී අඹ කන්ද, මැදගම්පොළ , අලව්ව ලිපිනයේ පදිංචි ඇය දිනකට රු 300/- පමණ ගමන් වියදමක් දරා සේවය සඳහා වාර්තා කරනු ලබන බවත් එමනිසා දැඩි ආර්ථික අපහසුතාවයන්ට මුහුණ දී ඇති බැවින්, සභා අරමුදලින් දීමනාව ලබා දෙන ලෙස ඇය විසින් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව, සභා අරමුදලින් දෛනික දීමනා පදනමක් මත ගෙවීම් සිදු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒවගේම ළදරු පාසල්වල පාලිකාවන් දරුවන් වෙනුවෙන් ඉතාම වෙහෙසකර කාර්යභාර්යක් ඉෂ්ට කරන බව මම ඇතුළුව ලක්ෂ්මී මන්ත්‍රීතුමියත් දන්නවා. ප්‍රාථමික අධ්‍යාපනය කියන්නේ ඉතාම වෙහෙසකර අධ්‍යාපනයක්. රු.7500.00 කියන්නේ අපිට හැරෙන්නවත් බැහැ. ඒ නිසා ගෙවීමට හැකි උපරිමයකට යටත්ව ගෙවීම් සිදු කරන ලෙස යෝජනා කරනවා.

ඒ අනුව මඩවල මද්දුම බණ්ඩාර පෙර පාසලේ පෙර පාසල් සහායිකාවක ලෙස සේවය කරන පී.ලක්ෂිකා මදුවන්ති විජේතුංග මිය සඳහා සභා අරමුදලින් දෛනික දීමනා පදනමක් මත ගෙවීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-29) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවෙන් කරනු ලබන යෝජනාව - අංක 07/04/05/29 දරණ යෝජනාව**
**පළාත් පාලන ආයතනවල නාගරික සංවර්ධනය වෙනුවෙන් බැංකු ගිණුම් විවෘත කිරීම**

2025.07.23 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා තීරණය අනුව, නාගරික සංවර්ධන අධිකාරිය මගින් නගර සංවර්ධන සඳහා ඒකාබද්ධ ගිණුමක් විවෘත කරන ලෙස දැනුවත් කර ඇති නමුත්, මේ දක්වා එම ගිණුම විවෘත කර නොමැති බැවින් එම ගිණුම කඩිනමින් විවෘත කරන ලෙස දන්වා නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (සැලසුම්) විසින් ලිපියක් යොමු කර තිබූ අතර, අනවසර ඉදි කිරීම සඳහා අය කරනු ලබන දඩ මුදල් හා වාහන නැවතුම් පහසුකම් ලබා දීමට නොහැකි ගොඩනැගිලි සඳහා එකවර අය කරනු ලබන සේවා ගාස්තු මෙම බැංකු ගිණුම වෙත යොමු කරන බව වැඩ අධිකාරී මහතා විසින් වැඩිදුරටත් පැහැදිලි කරන ලදී. ඒ අනුව, නගර සංවර්ධන සඳහා ඒකාබද්ධ ගිණුමක් විවෘත කිරීම සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාවට පක්ෂව අපිට කතා කරන්න බැහැ. හේතුව අපිට තියන දේවල් කතා කරලා උදුරගන්න එක තමා කරන්නේ. මේක ප්‍රශ්නයක් කියලා ලේකම්තුමිය කියයි. එයාලයි අපියි එකතු වෙලා ඒකාබද්ධ ගිණුමකට සම්බන්ධ වෙන්න අවශ්‍ය නැහැ. අපි හදන ගිණුමේ බලධාරියා විය යුත්තේ මුදල් පිළිබඳ බලය දරන පුද්ගලයයි. කඩයෙන් අය කර ගන්න මුදල් අය කර ගන්නේ ආදායම් පරීක්ෂක මහත්තයා, කඩය ඉස්සරහා පාර්කින් එකක් කරනවා නම් කාර්මික නිලධාරි මහත්තයා ඒක මැනලා දිය යුතුයි. ඒ ඔක්කොම කරාම අපි ඒකාබද්ධ ගිණුමක් හදලා දෙනවා අපේ සල්ලි ටික එයාලට ගෙනියන්න. ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව අවශ්‍ය නැත. මෙම යෝජනාවට මේ ගරු මහසභාවේ මහජන නියෝජතයින් හැටියට කිසිම කෙනෙක් සහයෝගය දෙයි කියලා මා විශ්වාස කරන් නැහැ. ගරු මිත්‍රවරුනි, සභාවට අයිති දේවල් උදුරගන්න අවස්ථාව දෙන්න එපා. මීට පෙර ඔබතුමාට මතක ඇති, අපට අයිති සෞඛ්‍ය සම්බන්ධ දේවල් ටික පළාත් එකට දෙන්න කියලා කියද්දී අපි දුන් නෑ. ඉතින් අපි මේ යෝජනාවට විරුද්ධයි.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය මගින් නගර සංවර්ධන සඳහා ඒකාබද්ධ ගිණුමක් විවෘත කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ ඉහත යෝජනාව ඒකමතිකව ප්‍රතික්ෂේප කරන ලදී.

**(05-30) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/04/05/30 දරණ යෝජනාව**
**ශ්‍රී සුධම්ම පෙර පාසල සඳහා පෙර පාසල් සහායිකාවක් බඳවා ගැනීම සම්බන්ධවයි.**

අලව්ව ප්‍රාදේශීය සභාවේ ස්ථිර පෙර පාසලක් වන මාබෝපිටිය ශ්‍රී සුධම්ම පෙර පාසලේ සහාය පාලිකාව 2025 මැයි මස අසනීප තත්වයක් හේතුවෙන් හදිසියේ මිය යාම නිසා පෙර පාසලේ සේවා කටයුතු සඳහා සහාය පාලිකාවකගේ අවශ්‍යතාවයක් පවතින අතර, මේ වන විට එක් පාලිකාවක් විසින් දරුවන් 35 දෙනෙක් රැකබලා ගනිමින් කටයුතු කරනු ලැබේ. දරුවන්ට දැනුම ආකල්ප කුසලතා සංවර්ධනයට අදාලව එක් එක් ක්‍රියාකාරකම් සිදු කරමින් පාලන කටයුතු කරගෙන යනු ලබන මෙම පෙර පාසලේ දරුවන්ගේ ආරක්ෂාව රැකවරණය දැඩි වෙහෙසකින් යුතුව සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය. දරුවන්ට විධිමත් රැකවරණයක් සලසා ගැනීම පිණිස එක් පෙර පාසල් සහායිකාවකගේ අවශ්‍යතාවය පවතින බවත්, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියෙන් පෙර පාසල් සංවර්ධන අරමුදලින් දීමනාව ගෙවීමට යටත්ව බඳවා ගැනීම සිදු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියෙන් පෙර පාසල් සංවර්ධන අරමුදලින් දීමනාව ගෙවීමට යටත්ව බඳවා ගැනීම සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**06.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

**(6.1)2025.07.14 සහ 2025.07.31 යන දිනයන්හි පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තා**
**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.07.14 සහ 2025.07.31යන දිනයන්හි පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තා ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.07.14 සහ 2025.07.31 යන දිනයන්හි පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තා සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.07.14 සහ 2025.07.31 යන දිනයන්හි පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තා ඒකමතිකව සභා සම්මත විය.

**(6.2) 2025.07.22 වන දින ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභා වාර්තාව**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.07.22 දින පැවති ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභා වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.07.22 දින පැවතිඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාවාර්තාවසභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.07.22 දින පැවති ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(6.3) <u>2025.07.23 වන දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.07.23 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.07.23 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.07.23 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් ඒකමතිකව සභා සම්මත විය.

**(6.4) <u>2025.07.23 වන දින කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.07.23 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.07.23 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.07.23 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(6.5) <u>2025.07.23 වන දින නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.07.23 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.07.23 වන දින නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.07.23 වන දින නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(6.6) <u>2025.07.23 දින පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.07.23 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.07.23 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.07.23 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## (6.7) 2025.07.29 දින සංවර්ධන උපදේශන කාරක සභා රැස්වීම් වාර්තාව

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.07.29 දින පැවති සංවර්ධන උපදේශන කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.07.29 දින පැවති සංවර්ධන උපදේශන කාරක සභා රැස්වීම් වාර්තාවසභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.07.29 දින පැවති සංවර්ධන උපදේශන කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.

## (07.1) 2025 ජූලි මාසය ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ජූලි මාසය ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ජූලි මාසය ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ජූලි මාසය ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට ඒකමතිකව සභා සම්මතවිය.

## (07.2) 2025 ජූලි මාසය ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ජූලි මාසය ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ජූලි මාසය ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ජූලි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(07.3) 2025 වර්ෂයේ දෙවන කාර්තුවට අදාළ අප්‍රේල්,මැයි සහ ජූනි මාසවලට අදාළ ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයේ දෙවන කාර්තුවට අදාළ අප්‍රේල්,මැයි සහ ජූනි මාසවලට අදාළ ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයේ දෙවන කාර්තුවට අදාළ අප්‍රේල්,මැයි සහ ජූනි මාසවලට අදාළ ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයේ දෙවන කාර්තුවට අදාළ අප්‍රේල්, මැයි සහ ජූනි මාස වලට අදාළ ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබඳ මාසික පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මතවිය.

**08. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෑත කාලයේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරනවා. ඒ යටතේ යත්තල්ගොඩ සිට රත්තරන්හේන දක්වා මාර්ගයේ තාර ගැලවිලා තියෙන තැන් ප්‍රතිසංස්කරණය කරනවා ඒක හොද කටයුත්තක්. මේ මාර්ගය අවුරුදු 10කින් තමා ප්‍රතිසංස්කරණය කලේ. නමුත් ඒක ප්‍රතිසංස්කරණය කරන්න ලක්ෂ 15ක් වැය වෙලා තියෙනවා. තව ලක්ෂ 05ක් වියදම් කරලා එක තාර කෝඩ් එකක් කරා නම් තව අවුරුදු 10කට මේ පාර පවතින්න පුළුවන් බව කොන්ත්‍රාත්කරු ප්‍රකාශ කරනවා. නමුත් මුදල් තත්වය කොපමණද කියලා දන්නේ නැහැ. ඔබ තුමාගේ අවධානය යොමු කරලා හැකියාවක් තිබේ නම් එම පාර සඳහා තව තාර කෝඩ් එකක් දැම්මොත් ලබන අවුරුද්දේ නැවත ප්‍රතිසංස්කරණය කරන්න සිදු වෙන්නේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මැතිවරණ ව්‍යාපාර කාලසීමාවේදී රත්තරන්හේන ප්‍රදේශයට ගිය අවස්ථාවේ එම ප්‍රදේශයේ ජනතාව ඊට විරෝධය ප්‍රකාශ කලා. නමුත් එම විරෝධය ප්‍රකාශ කල නිවසක්ම නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ඉදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළා. ඒ සම්බන්ධයෙන් මම මහජන නියෝජිතයෙක් වශයෙන් සතුටු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, බඹරගල පුරාණ විහාරස්ථාන මාර්ගයේ හාඩ්වෙයාර් ඉදිරිපස බෝක්කුව සම්බන්ධව පෙර දක්වපු අදහස්වලදී තාක්ෂණික නිලධාරී මහත්වරු පිළිබඳ දෝෂයක් මම ප්‍රකාශ කලේ නැහැ. තාක්ෂණික වශයෙන් ශක්තිමත්භාවය පිළිබඳ මට ගැටළුවක් නැහැ. ප්‍රියන්ත මන්ත්‍රීතුමා, ඔබතුමා වැරදියට වටහා ගන්න එපා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, වැවල ජංගම වැඩසටහන පවත්වන අවස්ථාවේදී මගේ ගෙදරට යන මාර්ගයේ ගෙවල් කිහිපයක් තියනවා ඒ පාර කවදාවත් හැදිලා තිබුණේ නැහැ. මේ වැඩසටහන හරහා පාර හැදිලා තිබුණා ඒ සම්බන්ධයෙන් ජනතාව ඔබතුමාට ස්තූතිය පුද කරන්න කීවා. ඒ වගේම නවතල්වත්ත කොට්ඨාසයේ විදුලි ලාම්පු සවි කරන්න එන අවස්ථාවේ මම දැනුවත් වෙලා හිටියේ නැහැ. සහෝදර මන්ත්‍රීතුමාට කතා කරාම ඔහු සමඟ ගොස් ලාම්පු 22 ක් විතර සවි කරා.

ඒ නිසා විදුලි ලාම්පු සවි කරන්න සැලසුම් කරන අවස්ථාවේ ඒ පිළිබඳව අපිව දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටින අතර, නවත්ලවත්ත ප්‍රදේශයටත් ජංගම සේවා වැඩසටහනක් පවත්වන්න කියලා ඉල්ලා සිටිනවා.

අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ඡා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වූ ගරු උප සභාපතිතුමිය ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියළු නිලධාරීන්ටත් ස්තූතිය පල කරන අතර අද දිනට නියමිත මහා සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 12.50ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

ඉහත සඳහන් වාර්තාව ස්ථිර කරන ලද බව සහතික කරමි.

2025.08.14
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.